# මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

# இலங்கை தேசிய மனிதவள அபிவிருத்தி சபை

# NATIONAL HUMAN RESOURCES DEVELOPMENT COUNCIL OF SRI LANKA

## වාර්ෂික වාර්තාව

## ஆண்டு அறிக்கை

## ANNUAL REPORT

## 2017

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

**Ministry of National Policies and Economic Affairs**

**தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார விவகாரங்கள் அமைச்சு**

354/2, නිපුණතා පියස, 7 වන මහල, ඇල්විටිගල මාවත, කොළඹ 05

354/2, 7 ஆம் மாடி, நிபுனதா பியச, எல்பிடிய மவாத்தை கொழும்பு - 05

354/2, NIPUNATHA PIYASA, 7TH FLOOR, ELVITIGALA MAWATHA, COLOMBO 05.

## ආයතනික පසුබිම

| | | |
|---|---|---|
| ආයතනය | : | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව |
| අමාත්‍යාංශය | : | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| ලිපිනය | : | 354/2, 7 වන මහල, නිපුණතා පියස, ඇල්විටිගල මාවත,<br>නාරාහේන්පිට, කොළඹ 05 |
| ඊ මේල් ලිපිනය | : | chairmannhrdc@yahoo.com |
| වෙබ් අඩවිය | : | www.nhrdc.gov.lk |
| දුරකථන අංකය | : | 0112595680 |
| ෆැක්ස් | : | 0112595680 |
| බැංකු කරුවන් | : | ලංකා බැංකුව<br>මහජන බැංකුව |

## දර්ශනය

අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක්

## මෙහෙවර

රටෙහි මානව සම්පත් සංවර්ධනය උදෙසා ඵලදායි ප්‍රතිපත්ති හා නව්‍යකරණ උපායමාර්ග සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැලසීම

## අගයන්

- සාමූහිකත්වය
- නිර්මාණශීලිත්වය
- පාරිභෝගික නැඹුරුතාව
- සමානාත්මතාව

## සභාපතිතුමාගේ ප්‍රකාශය

1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතින් මෙම සභාව කෙටි කාලයක් තුළ අමාත්‍යාංශ රැසකට අනුබද්ධවී කටයුතු කර ඇත. 2017 වර්ෂය වන විට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ සිය කටයුතු පවත්වා ගෙන යනු ලබයි.

මෙම ආයතනය සංස්ථාපනය කරන ලද පනතින් අපේක්ෂිත කාර්ය භාරය අනුව පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සංවිධානය කර තිබේ. ඉදිරි පර්යේෂණ සඳහා එසේ සැළසුම් කළ ව්‍යාපෘති ඇසුරෙන් එහි අන්තර්ගත දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහාත් හඳුනාගත් මෙහෙවර ඉටුකිරීම සඳහාත් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් ලෙස වෙන් කෙරුණ රුපියල් මිලියන 22.8 ක මූල්‍ය සීමාව යටතේ 2017 ක්‍රියාත්මක සැළැස්ම සකස්කර ඇත.

මෙම සැළැස්මේ ව්‍යාපෘතීන් තෝරා ගැනීමේදී අදාළ පනතේ 14.1 වගන්තියෙන් දක්වා ඇති ප්‍රධාන ක්ෂේත්‍රයන් අනාවරණය වන පරිදි ව්‍යාපෘති හඳුනා ගෙන ඇති අතර එම ප්‍රධාන ක්ෂේත්‍රයන් වනුයේ

(a) රැකීරක්ෂා, පුහුණුව සහ අධ්‍යාපනය
(b) විද්‍යාව සහ තාක්ෂණය උපයෝගී කර ගැනීම
(c) ජීවන තත්වය නංවාලීම
(d) අවාසිකර තැනැත්තන්ගේ කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂාව සැලසුම් කිරීම
(e) ආර්ථික ප්‍රතිසංස්කරණ මගින් හිමිකම් රැකදීම සම්බන්ධයෙන් වන හෝ අදාළ වන මානව සම්පත් බණ්ඩ පරිමේය කිරීම සහ සමෝධානය කිරීම වේ.

2017 වර්ෂය තුළදී, "අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක්" යන දැක්ම සහිත මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව ශ්‍රී ලංකාවේ මානව සම්පත සංවර්ධනය කිරීම වෙනුවෙන් කාර්යක්ෂම සහ සඵලදායී සේවාවක් සැපයීම උදෙසා පහත වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

# 2017 වර්ෂයේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

**පෞද්ගලික අංශයේ කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වය ඉහළ නැංවීම සඳහා ක්‍රමවේදයක්**

ශ්‍රී ලංකා ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කර ඇති 2016 ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණයේ සිව්වන කාර්තුවට අනුව වර්තමාන කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්ව අනුපාතය සියයට 36 කි. එබැවින් පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම සඳහා මැදිහත්වීමට අවශ්‍ය වන ප්‍රධාන අංශ පහක්, පත්කර ඇති කමිටුව විසින් හඳුනාගෙන ඇත.

- ජාතික ප්‍රතිපත්ති හා කම්කරු නීති ප්‍රතිසංස්කරණ
- රාජ්‍ය සහ පෞද්ගලික අංශවල මානව සම්පත් ප්‍රතිපත්ති සඳහා මැදිහත්වීම
- වැඩිපුර කාන්තාවන්ට සේවයේ යොදවා ගැනීම සඳහා පුද්ගලික අංශයට දිරිමත් කිරීම
- ජනමාධ්‍ය ඔස්සේ ප්‍රසිද්ධ විවාදයක් තුළින් සමාජ සංවේදීකරණය
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

අවසානයේ දී කමිටුව විසින් ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ ශ්‍රම දායකත්වය ඉහළ නැංවීම සඳහා ක්‍රමවේදයක් යන මැයෙන් වාර්තාවක් සකස් කර එම වාර්තාවේ පළමු පිටපත අග්‍රාමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයේ නියෝජ්‍ය ප්‍රධානී සහ හිටපු ඇමතිනී රෝසි සේනානායක මහත්මිය වෙත භාර දෙන ලදි.

**තාක්ෂණ අංශය සඳහා පුහුණු ශ්‍රමිකයන්**

වසර 5ක් පුරා, දත්ත තාක්ෂණ විද්‍යා වැඩසටහන් හා සම්බන්ධ තරුණයින් 1000 ක් බිහිකරලීම සඳහා කර්මාන්තය විසින් දියත් කරන ලද කඩිනම් පුහුණු වැඩසටහන සමඟ හවුල්වීම පිණිස මෙම වැඩසටහන පවත්වන ලදි. මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වූයේ අදාළ ආයතන සමඟින් ඉදිරි පස් වසර සඳහා නව දත්ත විද්‍යා වැඩසටහන් ආරම්භ කිරීමට හා කඩිනම් කිරීමට දත්ත තාක්ෂණ විද්‍යාව පිළිබඳ අවස්ථාවන් ඇතිකිරීම සහ තරුණයන් 1000 ක් බිහිකරලීමයි.

**මැදපෙරදිග රටවලින් ආපසු පැමිණෙන්නන් ප්‍රතිසංස්ථාපනය සඳහා ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම**

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණු වූයේ මැදපෙරදිග රටවලින් ආපසු පැමිණෙන සංක්‍රමණිකයන් ප්‍රතිසංස්ථාපනය කර ඔවුන් සඳහා අවස්ථා නිර්මාණය කිරීම හා පුහුණුව ලබාදීම පිණිස රාජ්‍ය හා පෞද්ගලික පාර්ශවකරුවන් සම්බන්ධ කිරීමයි. ඒ අනුව පිළිවෙලින් 2017 සැප්තැම්බර් 13 සහ නොවැම්බර් 21 යන දෙදින වත්තල හා මීගමුව යන ප්‍රදේශයන්හි දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් පවත්වන ලදී. වෘත්තීය අභිප්‍රේරණය, වෘත්තීය පුහුණුව සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ශක්තිමත් කිරීම සඳහා මෙම වැඩසටහන් සැලසුම් කරන ලදි.

**තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ සහයෝගීතාවයෙන් යුතුව ජාතික වෘත්තීය සුදුසුකම් පද්ධතිය හරහා තාක්ෂණ සහ වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ (සංචාරක) ගුණාත්මක ප්‍රමිතිය වැඩිදියුණු කිරීම**

කෙටි කාලීන අනාගතය සඳහා සංචාරක කර්මාන්තයේ කාර්යය මණ්ඩල අවශ්‍යතා තක්සේරු කිරීමට සහ එමගින් සංචාරක කර්මාන්තය සඳහා රටෙහි පවත්නා සියලු පුහුණු පහසුකම් ඇගයීමට ලක් කර පුහුණු අඩුපාඩුකම් ස්ථාපිත කිරීම ද අග්‍රාමාත්‍යවරයා විසින් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව වෙත පවරණ ලදි. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ තීරණාත්මක වර්ධනයක් සහිත කර්මාන්ත සඳහා කුසලතා සැපයීම හා සංචාරක ව්‍යාපාර කාර්යය බලකා දෙකක් ස්ථාපිත කිරීම මඟින් කර්මාන්තයේ අපේක්ෂිත අදහස් යෝජනා සහ යෙදවුම් විශ්ලේෂණය කිරීමයි.

**ත්‍රිරෝද රථ රියැදුරන් කර්මාන්තය තුළ නැවත සේවයේ යෙදවීම පිණිස *CSC* අනුමත උපාය මාර්ගයක් ක්‍රියාවට නැංවීම**

තීරණාත්මක වර්ධනයක් සහිත කර්මාන්ත සඳහා කුසලතා සැපයුම ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. ලංකා කම්කරු සංගමය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය, ජාතික වාණිජ මණ්ඩලය, ත්‍රිරෝද රථ සංගම් සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යන ආයතන සමඟින් සාකච්ඡා පවත්වන ලදි. පොලිස් පුහුණු පාසල, හෝටල් කර්මාන්තය, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ආංශික සභාව, ජාතික ආධුනික සහ කර්මාන්ත පුහුණු අධිකාරිය සහ ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමණාකාර ආයතනය සමඟ සහයෝගීතාවයෙන් යුතුව "සංචාරක ටැක්සි රියැදුරන්" සඳහා වන ජාතික වෘත්තීය සුදුසුකම් මොඩියුලය තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සංවර්ධනය කර ඇත.

**ත්‍රිරෝද රථ රියැදුරන් කර්මාන්තය තුළ නැවත සේවයේ යෙදවීම පිණිස ක්‍රමවේදයක් හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් පැවැත්වීම**

මෙම සමීක්ෂණයේ අරමුණු වූයේ; ත්‍රිරෝද රථ රියදුරන්ගේ සමාජ-ආර්ථික තත්ත්වය හඳුනාගැනීම, කුසලතා පුහුණු අවශ්‍යතාවයන් සහ ඉදිරි මාවත හඳුනාගැනීම, ප්‍රවාහන සේවාවන් සඳහා විකල්ප සේවාවන් හඳුනා ගැනීම සහ වර්ධනය වන ක්ෂේත්‍ර සඳහා ත්‍රිරෝද රථ රියැදුරන් සේවයේ යෙදවීම පිණිස ක්‍රමවේදයක් ගොඩනැගීමයි. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවෙහි සහාය ඇතිව කොළඹ, ගම්පහ, බදුල්ල, කුරුණෑගල, රත්නපුර සහ ගාල්ල යන දිස්ත්‍රික්ක හයක මෙම අධ්‍යයනය සිදු කර ඇත.

**රාජ්‍ය නිලධාරීන් සඳහා විදේශ පුහුණු වැඩසටහන - 2017**

2017 වර්ෂයේදී පොදු රාජ්‍ය අංශයේ කළමනාකරණ කාර්ය මණ්ඩලය, පාසල්වල විදුහල්පතිවරුන්, විශ්වවිද්‍යාල පරිපාලන කාර්ය මණ්ඩලය සහ විශ්ව විද්‍යාල කාර්මික නිලධාරීන් වැනි විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා විදේශ පුහුණු වැඩසටහන් අටක් සංවිධානය කිරීමට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවට හැකි විය. මෙම වැඩසටහන්වල ප්‍රධාන අරමුණ වනුයේ රැකියා ආශ්‍රිත නිපුණතා සහ රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ පෞද්ගලික වර්ධනය ඉහළ නැංවීමයි.

**ඵලදායී හා සදාචාරාත්මක රාජ්‍ය සේවා සංස්කෘතියක් සඳහා පොදු නිපුණතා රාමුවක්**

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව ප්‍රවීණ මඩුල්ලක් සමඟ සිදුකරන ලද අධ්‍යයනයක් මත පදනම්ව, රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා පොදු නිපුණතා රාමුවක් ගොඩනගා ඇත. 2017 ජූනි මස 27 වන දින පවත්වන ලද රැස්වීමේදී අමාත්‍ය මණ්ඩල කමිටුව විසින් පොදු නිපුණතා රාමුව අනුමත කර ඇත.

**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවේ දේශන මාලාව**

කළමනාකාර මට්ටම්වල සිටින රාජ්‍ය සේවකයින්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අපගේ සභාව විසින් දේශන මාලාවක් පවත්වා ඇති අතර, එනම්, සේවාලාභී සත්කාරය, මානව විශ්වාසය, ඉහළ මානව සම්පත් ප්‍රවණතා, රාජ්‍ය අංශයේ ගිණුම් කුසලතාවයන් ඉහළ නැංවීම, යහ පාලනය සහ රාජ්‍ය සේවයේ කාර්යභාරය, සයිබර් සුරකුම් කතාබහ සහ රාජ්‍ය අංශය සඳහා ඵලදායී කාර්ය ක්‍රම හඳුන්වාදීම වේ. රාජ්‍ය අංශයේ සේවකයින්ගේ අභිවෘද්ධිය සඳහා පවත්වනු ලබන දේශන මාලාව සම්බන්ධයෙන් රාජ්‍ය අංශයෙහි විවිධ අංශ නියෝජනය කරමින් සහභාගිවන්නන් බොහොමයක් ධනාත්මක ප්‍රතිචාර දක්වා ඇත. විවිධ පැතිකඩ ආවරණය වන පරිදි නිපුණ දේශක මඩුල්ලක් හරහා රාජ්‍ය නිලධාරීන් සඳහා දේශන මාලාවක් ඉදිරියට ද සිදුකිරීමට නියමිතය.

**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවෙහි සංඛ්‍යාලේඛන ප්‍රකාශනය**

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වකරුවන්ගේ තොරතුරු පරතරය අවම කිරීම සඳහා සංඛ්‍යාන අත්පොත වාර්ෂිකව ප්‍රකාශයට පත් කෙරේ. මේ සම්බන්ධයෙන් නවතම ප්‍රකාශනය 2017 වසරේ දී පළකර ඇත.

**අධ්‍යක්ෂවරුන්ගේ අත්පොත**

ගරු කථානායකතුමාගේ මඟපෙන්වීම මත, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහයෝගය ඇතිව මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව විසින් පවත්නා මාර්ගෝපදේශ යාවත්කාලීන කරමින් රාජ්‍ය ව්‍යවසායන්හි සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා යහපාලනය නම් අත්පොතක් සකස් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය අවශ්‍ය කරන විශිෂ්ඨතම ප්‍රායෝගික ක්ෂේත්‍ර පිළිබඳව මාර්ගෝපදේශනය සහ පැහැදිලි කිරීම මෙම අත්පොත මඟින් සපයයි. රාජ්‍ය ව්‍යවසායන්හි සභාපතිවරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩල වෙත යොමු කරන ලද යහපාලනය පිළිබඳ මෙම අත්පොත එම ආයතනවල කටයුතු ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට මගපෙන්වීමක් වනු ඇත. එය ප්‍රධාන වශයෙන් වාණිජ රාජ්‍ය ව්‍යාපාර වලට අදාළ වේ. මෙම අත්පොතේ මුල් පිටපත 2017 දෙසැම්බර් මස 5 වැනි දින පැවති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ වාර්ෂික සම්මාන ප්‍රදානෝත්සවයේදී ගරු අග්‍රාමාත්‍යවරයා වෙත භාරදෙන ලදි.

**“රාජ්‍ය අංශයේ සේවය කිරීමේ නව මාර්ග ” නම් වූ වාර්තාව**

රාජ්‍ය අංශයේ සේවය කිරීමේ මාර්ග වැඩිදියුණු කිරීම පිළිබඳ වාර්තාවක් ජාතික මානව සම්පත් සංවර්ධන සභාව විසින් සකස් කර ඇත. මෙය ජනාධිපතිතුමා සහ අග්‍රාමාත්‍යතුමා වෙත යොමු කර ඇති අතර, කාර්යයන් ඉදිරියට සිදුකිරීම සඳහා ප්‍රතිචාර අපේක්ෂාවෙන් සිටී.

රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය මෙන්ම ප්‍රතිපත්ති හා භාවිතයන් සම්බන්ධව අඛණ්ඩභාවය, ඵලදායිතාවය ඉහළ නැංවීම, විශේෂයෙන් කිසියම් පත්වීම් ලබා දීම් සම්බන්ධයෙන් තාර්කිකයන් නියම කිරීම සහ ඒකඟතාවයට පැමිණි ඉලක්ක සඳහා අභ්‍යන්තරික විශ්වාසය ද ඇතුළත්ව වගවීම් යාන්ත්‍රණ සඳහා ආරක්ෂාව සපයා ගැනීම වාර්තාව මඟින් ආමන්ත්‍රණය කරන ලද ක්ෂේත්‍ර අතරට ගැනේ.

**විගණන කමිටුවල යහපාලනය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ ජාතික මානව සම්පත් සංවර්ධන සභාව ප්‍රයත්නයක**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ ජාතික මානව සම්පත් සංවර්ධන සභාව සමඟ එක්ව රාජ්‍ය ව්‍යවසායන්හි විගණන කමිටු නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් 180 වඩා වැඩි දෙනෙකුගේ සහභාගිත්වය ඇතිව “ විගණන කමිටුවල කාර්යභාරය ” මැයෙන් වැඩමුළුවක් පවත්වන ලදි. අගමැතිවරයාගේ මෙහෙයවීම යටතේ යහපාලනය නංවාලීම සඳහා වූ රජයේ ඉලක්කයට සහාය දැක්වීම සහ රාජ්‍ය ව්‍යවසායන්හි අධ්‍යක්ෂවරුන් සඳහා ඒකීය කුසලතා සමූහයන් නිර්මාණය කිරීම මෙම වැඩ පිළිවෙළ හරහා ක්‍රියාත්මක වේ.

දිනේෂ් වීරක්කොඩි
සභාපති

# පටුන

1.ආයතනික පසුබිම හා විෂය පථය ........ 1

2. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන ව්‍යුහය ........ 4

3.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන සටහන ........ 6

4.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සේවක ලැයිස්තුව හා ඔවුන්ගේ තනතුරු .... 7

5. ව්‍යාපෘති සහ වැඩසටහන් ........ 11

5.1 පෞද්ගලික අංශයේ කාන්තා ශ්‍රම බලකාය වැඩිදියුණු කිරීම සඳහා මාර්ග සිතියමක් ........ 11

5.2 තාක්ෂණික අංශය සඳහා පුහුණු ශ්‍රමිකයින් ........ 15

5.3 මැදපෙරදිග සිට ආපසු පැමිණෙන්නන් නැවත රැකියාගත කිරීම ........ 15

5.4 TVET අංශයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම ........ 20

5.5 ත්‍රිරෝද රියැදුරන් කර්මාන්තගත කිරීම ........ 24

5.6 රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා විදේශ පුහුණු වැඩසටහන් - 2017 ........ 25

5.7රාජ්‍ය සේවකයින් සඳහා පොදු ප්‍රවීණතා රාමුව ........ 28

5.8 දේශන මාලාව 2017 ........ 28

5.9 NHRDC හි සංඛ්‍යාන අත්පොත ........ 30

5.10 අධ්‍යක්ෂවරුන්ගේ අත්පොත ........ 30

5.11 "රාජ්‍ය අංශයේ සේවය කිරීමේ නව මාර්ග" මැයෙන් වූ වාර්තාව ........ 31

5.12 විගණන කමිටුවල යහපාලනය වැඩිදියුණු කිරීම ........ 31

6. මානව සම්පත් සංවර්ධන සභාවේ 2017 වර්ෂයේ ප්‍රකාශන ........ 33

7. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය ........ 34

8. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ........ 36

9. 2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/කොටස්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය ........ 37

10. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය ........ 38

11. සටහන් ........ 40

12. වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්තීන් සහ අනිකුත් අර්ථ විවරණ සටහන්වල සාරාංශයකින් සමන්විත සටහන් ........ 47

13.විගණන වාර්තාව හා පිළිතුරු ........ 51

## 1.ආයතනික පසුබිම හා විෂය පථය

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව මානව සම්පත් සංවර්ධනය පිළිබඳ වැදගත් කාර්ය භාරයක් ඉටුකිරීමට 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතින් ස්ථාපිත කරන ලද ආයතනයකි. එම ආයතනයට ලබාදී ඇති බලතල යටතේ මානව සම්පත් සංවර්ධනයෙහිලා සියලු කටයුතුවලදී ප්‍රමුඛතාවය දීමටත් මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් ප්‍රතිපත්ති සකස් කිරීමටත් ප්‍රවර්ධනය කිරීමටත් ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දීමටත් යනාදී වැදගත් කාර්යභාරයනට වගකීම දරයි. එහි මූලික අරමුණ වනුයේ අදාල අමාත්‍යවරයාටත්, රජයටත් මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් නිර්දේශ ලබා දෙන උසස් මට්ටමේ ආයතනයක් ලෙස සංවිධානය වීමයි.

## 1.1ආයතනික හැඳින්වීම

ජාතික මට්ටමේ උපදේශක මණ්ඩලයක් වශයෙන් 1987 ජුනි මස 05 වන දින මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව ආරම්භ වූයේ යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ඒකකයක් වශයෙනි. ඉන් ඉක්බිතිව 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනත මඟින් ස්වාධීන ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදි. එතැන් සිට කෙටි කාලයක් තුළදී, එනම් 2000 වර්ෂයේදී මෙම ආයතනය කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතට පැවරෙන අතර, 2001 දී එය අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතටද ඉන්පසු නිපුණතා සංවර්ධන, වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශයේද යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ පාලනයටද නතු විය. මෙසේ කෙටි කාලයක් තුළ අමාත්‍යාංශ රැසකට අනුබද්ධවී කටයුතු කළ මෙම ආයතනය, වර්තමානයේදී **ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය** යටතේ සිය කටයුතු පවත්වා ගෙන යයි.

### 1.2 දර්ශනය

"අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක්"

### 1.3 මෙහෙවර

රටෙහි මානව සම්පත් සංවර්ධනය උදෙසා ඵලදායි ප්‍රතිපත්ති හා නව්‍යකරණ උපායමාර්ග සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැලසීම

### 1.4 අරමුණ

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ අරමුණ වනුයේ රජයට මානව සම්පත් සංවර්ධනය උදෙසා උපදෙස් සහ මාර්ගෝපදේශකත්වය ලබා දීමට සුදුසු ආයතනික රාමුවක් බිහිකිරීමයි. මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාවලි සැලසුම, ප්‍රතිපත්ති සමාලෝචනය හා මානව සම්පත් අංශ වර්ධනය කිරීමත් යනාදී අංශ සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව වගකීම් දරයි. සභා පනතට අනුව සභාවේ කාර්ය සහ කර්තව්‍ය පහත සඳහන් පරිදි වේ.

1. (අ) රැකී රක්ෂා, පුහුණුව හා අධ්‍යාපනය
   (ආ) විද්‍යාව හා තාක්ෂණය උපයෝගී කර ගැනීම
   (ඇ) ජීවන තත්වය නංවාලීම
   (ඈ) අවාසිකර තැනැත්තන්ගේ කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂාව සැලසුම් කිරීම
   (ඉ) ආර්ථික ප්‍රතිසංස්කරණ මගින් හිමිකම් රැකදීම සම්බන්ධයෙන් වන හෝ අදාළ වන මානව සම්පත් ඛණ්ඩ පරිමේය කිරීම සහ සමෝධානය කිරීම ඇතුළුව, ජාතික මානව සම්පත් ප්‍රතිපත්තියේ සියලු අංශවලින් අමාත්‍යවරයාට උපදෙස් දීම

2. ජාතික ප්‍රතිපත්තියට අනුකූල වූ මානව සම්පත් සංවර්ධනය කිරීමේ සැලසුම් හා වැඩසටහන් රජයට ඉදිරිපත් කිරීම සඳහා විෂයභාර අමාත්‍යවරයාට නිර්දේශ කිරීම.

3. ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය සහ ක්‍රියාත්මකව පවත්නා සැලසුම් සහ වැඩසටහන් කලින් කල සමාලෝචනය කිරීම හා පරීක්ෂා කර බැලීම සහ අවශ්‍ය වන විටක, ඒ ප්‍රතිපත්තියට සැලසුම්වලට හා වැඩසටහන්වලට කළයුතු වෙනස් කිරීම්, අමාත්‍යවරයාට නිර්දේශ කිරීම.

4. ආණ්ඩුව විසින් අනුමත කරන ලද මානව සම්පත් සංවර්ධන සැලසුම් සහ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ගැන සොයා බැලීම

5. මේ පනතේ උපලේඛනයේ සඳහන් කවර හෝ විෂයයන් හා සම්බන්ධ යම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම. එසේ වුවද එම ව්‍යාපෘතිය වෙනත් යම් අමාත්‍යවරයෙකුට පවරා තිබෙන විෂයයන් හා සම්බන්ධ වන අවස්ථාවක, එය ක්‍රියාත්මක කිරීම, ඒ වෙනත් අමාත්‍යාවරයාගේ එකඟත්වය ඇතිව විය යුතුය සහ

6. ජාතික අරමුණුවලට අනුකූලව මානව සම්පත් සංවර්ධනය කිරීමට අවශ්‍ය යයි හෝ හිතකර යයි හෝ ආනුෂංගික යයි සභාව අදහස් කරන වෙනත් සියලු ක්‍රියා සිදුකිරීම

## 1.5 සභාව සතු බලතල

1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතේ 16 (2) (1) වන උප වගන්තිය අනුව සභාව සතු බලතල මෙසේය.

අ) සභාවේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍යවන සමීක්ෂණ, විමර්ශන, අධ්‍යයන සහ පර්යේෂණ කිරීමට.

(ආ) මානව සම්පත් සංවර්ධනයට අදාළව කරුණු සම්බන්ධයෙන් විශේෂඥයන්ගේ, වෘත්තිකයන්ගේ හෝ මහජනයාගේ මතය දැන ගැනීම සඳහා ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව කරුණු විමසීමට.

(ඇ) සභාව විසින් ඉටුකරනු ලබන කර්තව්‍යවලට සමාන කර්තව්‍ය ඉටු කරන ශ්‍රී ලංකාවෙන් බැහැර පිහිටි ජාත්‍යන්තර නියෝජ්‍යායතන සහ වෙනත් සංවිධාන සමඟ සම්බන්ධතා ඇතිකර පවත්වාගෙන යාමට.

(ඈ) මේ පනත යටතේ සභාවේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සියලු කොන්ත්‍රාත්තුවලට සහ ගිවිසුම්වලට එළඹීමට සහ ඒවා ඉටු කිරීමට.

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ විදේශීය රටවල පිහිටි ආයතන හෝ පුද්ගලයින් මගින් මානව සම්පත් සංවර්ධන පර්යේෂණ පැවැත්වීම සඳහා කටයුතුවල යෙදීමට.

(ඊ) මානව සම්පත් සංවර්ධනය හා ඊට සම්බන්ධ ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු දත්ත බැංකුවක් පිහිටුවා පවත්වාගෙන යාමට.

(උ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරිකිරීම් හෝ තැන්පතු ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට.

(ඌ) චංචල සහ නිශ්චල යන දෙවර්ගයේම ආධාර හා පරිත්‍යාග පිළිගැනීමට සහ භාරගැනීමට.

(එ) මානව සම්පත් සංවර්ධනයේ විවිධ අංශවල නිපුණ විශේෂඥ සංචිතයක් සංවර්ධනය අරමුණු කර ගෙන සභාවේ නිළධරයන්ගේ දක්ෂතා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට.

(ඒ) සභාවේ කර්තව්‍ය සාර්ථක ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය වන කමිටු විශේෂඥ කණ්ඩායම් සහ උපදේශක මණ්ඩල පත් කිරීමට.

(ඔ) අමාත්‍යාංශවලින්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලින්, රාජ්‍ය සංස්ථාවලින්, ව්‍යවස්ථාපිත මණ්ඩලවලින්, පළාත් සභාවලින්, පළාත් පාලන ආයතනවලින් සහ පෞද්ගලික අංශයේ ආයතනවලින් ලබා ගන්නා සංඛ්‍යා ලේඛන ඇතුළුව සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන තොරතුරු ඉල්ලා සිටීමට සහ ඒවා ලබා ගැනීමට.

(ඕ) සභාවේ කර්තව්‍ය බලතල සහ කාර්ය ඉටු කිරීම ක්‍රියාත්මක කිරීම සහ සිදු කිරීම සඳහා අවශ්‍ය යැයි හිතකර යැයි හෝ ආනුෂංගිකයයි සභාවේ මතය අනුව සභාව විසින් සලකනු ලබන සියලු පියවර ගැනීමට.

## 2. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන ව්‍යුහය

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම සභාව 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතේ දැක්වෙන විධි විධාන අනුව පත් කරනු ලබන සභාපතිවරයෙකුගෙන් හා සාමාජිකයන් 20 දෙනෙකුගෙන් සමන්විත වේ. ඉන් 15 දෙනෙකු නිල බලයෙන් පත්වන අතර අදාළ ආයතනවලින් 5 දෙනෙකු සාමාජිකයන් ලෙස පත්වනු ඇත. ඒ හැරුණු විට අදාළ ක්ෂේත්‍රයන්හි පලපුරුද්ද හැකියාව යනාදිය සලකා 5 දෙනෙකු පත්කරනු ලබන අතර මින් දෙදෙනෙකු පුද්ගලික අංශයෙන් වේ. සභා සභිකයන් අතුරෙන් එක් අයෙකු විධායක සභාපති සේ නම් කිරීමට විෂයභාර ඇමතිතුමාට බලය පැවරේ. මෙහි ප්‍රධාන විධායක නිළධාරියා වනුයේ සභාවේ සභාපතිය. 2017.12.31 දින වනවිට සාමාජිකයන් 20 දෙනෙකුගෙන් සමන්විත විය. 2017.12.31 දිනට සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය.

**පනතේ 3(1) (අ) සිට (ව) දක්වා වගන්ති යටතේ කර ඇති පත්වීම්**

1. සභාපති, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව
2. ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
3. ලේකම්, උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය
4. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
5. ලේකම්, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
6. ලේකම්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය
7. ලේකම්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
8. ලේකම්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
9. ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
10. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
11. සභාපති, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
12. අධ්‍යක්ෂ ජනරාල්, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
13. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
14. සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
15. සභාපති, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
16. ලේකම්, මුදල් අමාත්‍යාංශය

**පනතේ 3(2) (ජ) වගන්තිය යටතේ කර ඇති පත්වීම**

1. මහාචාර්ය කාමෙනා ගුණරත්න මිය - පීඨාධිපති, මානව හා සමාජ විද්‍යා පීඨය,විවෘත විශ්ව විද්‍යාලය
2. මහාචාර්ය රංගික හල්වතුර මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මොරටුව විශ්ව විද්‍යාලය
3. වෛද්‍ය රනිල් අබේසිංහ මහතා - 178, ජෝර්ජ් ද සිල්වා මාවත, මහනුවර
4. ආචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙණිය - 165/1සී, පොල්හේන්ගොඩ පාර, කොළඹ 05

**2017** **වර්ෂයේ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ පාලක මණ්ඩල රැස්වීම් පැවැත් වූ දිනයන් හා සහභාගි වූ සාමාජිකයන් පිලිබද විස්තර -**

| # | පාලක මණ්ඩල සාමාජික සහ ආයතනය | 2017.03.14 | 2017.06.12 | 2017.09.15 | 2017.12.12 |
|---|---|---|---|---|---|
| 01. | සභාපති, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව | √ | √ | √ | √ |
| 02. | ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | √ | √ | - | - |
| 03. | ලේකම්, උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය | - | √ | √ | - |
| 04. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය | √ | - | √ | - |
| 05. | ලේකම්, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | √ | - | - | - |
| 06. | ලේකම්, කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | √ | √ | √ | √ |
| 07. | ලේකම්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | - | - | √ | - |
| 08. | ලේකම්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | √ | - | - | - |
| 09. | ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | √ | - | - | √ |
| 10. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය | - | - | - | - |
| 11. | සභාපති, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | - | - | √ | √ |
| 12. | අධ්‍යක්ෂ ජනරාල්, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | √ | √ | - | √ |
| 13. | සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | √ | - | * | √ |
| 14. | සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | - | √ | √ | √ |
| 15. | සභාපති, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | √ | √ | - | - |
| 16. | නියෝජිත, මුදල් අමාත්‍යාංශය | √ | * | * | √ |
| 17. | මහාචාර්ය කාමෙනා ගුණරත්න (පත්කළ සාමාජික) | √ | √ | √ | - |
| 18. | මහාචාර්ය රංගික හල්වතුර (පත්කළ සාමාජික) | √ | √ | √ | - |
| 19. | වෛද්‍ය රනිල් අබේසිංහ (පත්කළ සාමාජික) | √ | - | - | - |
| 20. | ආචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙණිය | √ | √ | - | √ |
| | සහභාගි වූ මුළු සංඛ්‍යාව | 15 | 10 | 09 | 09 |

* පත්කර නොමැත

## 3.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන සටහන



**4.**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සේවක ලැයිස්තුව හා ඔවුන්ගේ තනතුරු

| තනතුරු නාමය | අනුමත සේවක සංඛ්‍යාව | 2017.12.31 දිනට සේවයේ යෙදී සිටින සංඛ්‍යාව | 2017.12.31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව | නම |
|---|---|---|---|---|
| සභාපති | 01 | 01 | - | දිනේෂ් වීරක්කොඩි මහතා |
| අධ්‍යක්ෂ | 01 | 01 | - | කේ.ඒ ලලිතධීර මහතා |
| සහකාර අධ්‍යක්ෂ | 03 | 03 | | ජේ.ඒ.සී.පී. ජයසිංහ මිය<br>එස්. තනගසීලන් මහතා<br>එන්.යූ.එස්.කරුණාසේකර මිය |
| සභා ලේකම්/නීති නිලධාරි | 01 | 01 | - | ජී.ජී. කසුනි උත්පලා මෙනවිය |
| පර්යේෂණ නිලධාරි | 04 | 04 | - | ආර්.එම්.ඒ. යූ.කේ. රත්නායක මිය<br>එම්.ඒ.එච්.ඩී.සී පෙරේරා මිය<br>ඩී.සෙන්තිල්නාදන් මහතා<br>එන්.ඩී එදිරිසිංහ මෙනවිය |
| පරිපාලන නිලධාරි | 01 | 01 | - | කේ.වී.එස්. එරංගා මිය |
| භාෂා පරිවර්තක | 01 | - | 01 | - |
| සංවර්ධන නිලධාරි | 04 | 04 | - | පී.ටී.එස්. ද සිල්වා මිය<br>ආර්.ඩී.සී.එස්. රාජපක්ෂ මහතා<br>කේ.පී.පී. පෙරේරා මහතා<br>කේ.සී ගුරුසිංහ මිය |
| සභාපතිගේ පෞද්ගලික සහකාර | 01 | - | 01 | - |
| කළමනාකරණ සහකාර | 08 | 07 | 02 | සී.ආර්. මද්දගේ මහතා<br>එම්.ජී.එන්. දිල්හාරි මිය<br>කේ.සී මුතුමාල මෙනවිය<br>ආශා සුරේනි එදිරිසිංහ මිය<br>ජී.එම් සද්ධාමංගල මිය<br>ආර්.එල්.අයි සංජීවනී මෙනවිය |
| රියැදුරු | 04 | 03 | 01 | ජී.එම්. පින්නදුව මහතා<br>ටෙරන්ස් පියල් මහතා<br>ආර්.සී.ආර්. ජයවර්ධන මහතා |
| කාර්යාල සහායක | 04 | 03 | 01 | එන්.ජී. නදුන් මධුරංග මහතා<br>ඩබ්.ආර්.ඒ. ප්‍රින්ස් ග්‍රැන්විල් මහතා<br>ඒ. නයනා ප්‍රියදර්ශනී මෙනවිය |
| **මුළු එකතුව** | **33** | **27** | **06** | |

**නව බඳවා ගැනීම්**

| නම | තනතුර | බඳවාගත් දිනය |
|---|---|---|
| එන්.යූ.එස්. කරුණාසේකර මිය | සහකාර අධ්‍යක්ෂ(මූල්‍ය) | 2017.01.23 |
| ආර්.සී.ආර්. ජයවර්ධන මයා | රියැදුරු | 2017.05.04 |

**සේවයෙන් ඉල්ලා අස්වීම්**

| නම | තනතුර | ඉල්ලා අස්වූ දිනය |
|---|---|---|
| ඩබ්.එම්. ලක්ෂිත රජිත් මයා | කළමනාකරණ සහකාර | 2017.09.29 |
| ඩී.එච්.ඩබ්. අසංක ලක්මාල් මයා | රියැදුරු | 2017.10.03 |

**දේශීය සහ විදේශීය පුහුණුව**

මා.ස.ස.ශ්‍රී.ජා.සභාවේ කාර්ය මණ්ඩලයේ විෂය දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණින්, සමාලෝචිත වර්ෂය තුළ ඔවුන් සඳහා දේශීය හා විදේශීය පුහුණුව ලබා දී ඇත. 2017 වර්ෂය තුළ පුහුණුවීම් සඳහා සහභාගි වූ නිලධාරීන්ගේ විස්තර පහත දැක්වේ.

**දේශීය පුහුණුව – ඒක පුද්ගල/කණ්ඩායම්**

| | **ඒක පුද්ගල පුහුණුව** | | | |
|---|---|---|---|---|
| **අංකය** | **නම** | **තනතුර** | **පුහුණු වැඩ සටහනේ නම** | **ආයතනය** |
| 1 | එම්. සද්ධාමංගල මිය | කළමනාකරණ සහකාර | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වෘත්තීය සුදුසුකම | පිරිස් කළමනාකරණ ආයතනය (IPM) |
| 2 | කේ.වී. එස් එරංගා මිය<br>ආර්.සී. ආර්. ජයවර්ධන මයා | පරිපාලන නිලධාරි<br>රියැදුරු | නිලාරම්භක පුහුණුව සහ ධනාත්මක චින්තනය | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල |
| 3 | ආචාර්ය කේ.ඒ. ලලිතධීර මයා | අධ්‍යක්ෂ | සහතිකලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ වැඩසටහන | සහතිකලත් වෘත්තීය කළමනාකරුවන්ගේ සංගමය(CPM) |
| 4 | මධුභාෂිනී සද්ධාමංගල මෙනෙවිය | කළමනාකරණ සහකාර | විධායක සංවර්ධන පුහුණු වැඩසටහහන | පිරිස් කළමනාකරණ ආයතනය (IPM) |
| 5 | කේ.වී. එස් එරංගා මිය | පරිපාලන නිලධාරි | අභ්‍යන්තර විගණන සහ අභ්‍යන්තර පාලන පද්ධති | සී/ස නිපුණතා සංවර්ධන අරමුදල |
| 6 | ජේ.ඒ.සී.පී. ජයසිංහ මිය | සහකාර අධ්‍යක්ෂ | විධිමත් වාර්තා ලිවීමේ කුසලතා | මිලෝදා ආයතනය |
| 7 | එන්. යූ.සී. කරුණාසේකර මිය | සහකාර අධ්‍යක්ෂ | රාජ්‍ය අංශයේ මූල්‍ය රෙගුලාසි | මිලෝදා ආයතනය |
| 8 | ජේ.ඒ.සී.පී. ජයසිංහ මිය | සහකාර අධ්‍යක්ෂ | ඵලදායිතා වර්ධනය සඳහා නායකත්වය | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය |
| 9 | එන්.ඩී.එදිරිසිංහ මිය | පර්යේෂණ නිලධාරි | ඊ-වීව්ස් මෘදුකාංග භාවිත කරමින් ව්‍යවහාරික ආර්ථික විද්‍යා ප්‍රායෝගික ප්‍රවේශය | මහ බැංකුව |
| 10. | ජී.ජී. කසුනි උත්පලා මිය | නීති නිලධාරි සහ සභා ලේකම් | CPM කලාපීය කළමනාකරණ සමුළුව– පරිණාමන නායකත්වය | සහතිකලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනය |
| 11 | ආචාර්ය කේ.ඒ. ලලිතධීර මයා | අධ්‍යක්ෂ | *CMA* ජාතික කළමනාකරණ ගිණුම්කරණ සමුළුව | සහතිකලත් වෘත්තීය කළමනාකරුවන්ගේ සංගමය |

**විදේශීය පුහුණුව**

| අංකය | නම | තනතුර | පුහුණු වැඩ සටහනේ නම | ආයතනය |
|---|---|---|---|---|
| 01 | එස්. තනීගසිලන් මයා | සහකාර අධ්‍යක්ෂ | කළමනාකරණ සංවර්ධන නිපුණතා සංවර්ධන - පුහුණු | පුත්‍රා විශ්ව විද්‍යාලය, මැලේසියාව |
| 02 | ආචාර්ය කේ.ඒ. ලලිතධීර මයා | අධ්‍යක්ෂ | TFI @10 ආසියානු නිපුණතා නායක සංසදය 2017 | ITE අධ්‍යයන සේවා (ITEES) සිංගප්පූරුව |
| 03 | ජේ.ඒ.සී.පී. ජයසිංහ මිය | සහකාර අධ්‍යක්ෂ | කළමනාකරණ සංවර්ධන නිපුණතා සංවර්ධන - පුහුණු | පුත්‍රා විශ්ව විද්‍යාලය, මැලේසියාව |
| 04 | එම්.ඒ.එච්.ඩී.පෙරේරා මයා | පර්යේෂණ නිලධාරි | කළමනාකරණ සංවර්ධන නිපුණතා සංවර්ධන -පුහුණු | පුත්‍රා විශ්ව විද්‍යාලය, මැලේසියාව |

# 5. 2017 වර්ෂය තුළ සිදු කරන ලද ව්‍යාපෘති / වැඩසටහන්

## 5.1 පෞද්ගලික අංශයේ කාන්තා ශ්‍රම බලකාය වැඩිදියුණු කිරීම සඳහා මාර්ග සිතියමක්

ශ්‍රී ලංකා ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කර ඇති ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණයේ 2016 වසරේ සිව්වන කාර්තුවට අනුව වත්මන් කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්ව අනුපාතය සියයට තිස් හයකි. ශ්‍රම බලකායට සම්බන්ධවීම සඳහා ඔවුන්ගේ ඇති අභිප්‍රේරණය අඩුවීමට හේතු බොහොමයක් අධ්‍යයන සහ ප්‍රතිපත්ති පත්‍රිකා මඟින් සොයාගෙන ඇත. (ගුණතිලක 2013, ගුණවර්ධන, 2015, ILO 2016, ගුණතිලක, 2017). ලොව පුරා විවිධාකාර අධ්‍යයනවලින් පෙන්නුම් කරන්නේ කාන්තාවන් වැටුප් සහිත රැකියාවක නියැලීම ඔවුන්ගේ පවුල්, ප්‍රජාවන් සහ රටවල් වඩා ධනවත් බවට පත්කරන බවයි. අනික් අතට, එක්සත් ජනපදයේ හා චීන ආර්ථිකයේ ප්‍රමාණාත්මකව ආර්ථිකයන් තුළ කාන්තාවන් සහභාගි නොවීම මඟින් දළ දේශීය නිෂ්පාදිතයට ඇතිවන ගෝලීය අලාභය එමඟින් තක්සේරු කර තිබේ. (McKinsey ගෝලීය ආයතනය, 2015).

යල්පැන ගිය ව්‍යවස්ථා සම්පාදනයන්හි සිට වෘත්තීය පුහුණුව සඳහා ප්‍රවේශය නොමැතිවීම දක්වා විහිදී ගිය සාම්ප්‍රදායික ශ්‍රම බලකායේ කාන්තාවන්ගේ සහභාගිත්වය සඳහා ඇති බාධක කිහිපයක් පිළිබඳ සාක්ෂි පෙන්වා දෙයි. ශ්‍රම වෙළඳපොළ තුළ කාන්තාවන් අන්තර්ගත වීම නිර්ණය කිරීමේ දී සමාජ හා සංස්කෘතික සාධක සුවිශේෂී කාර්යභාරයක් ඉටු වන බව බෙහෙවින් පැහැදිලිව ඇත.

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ අනුග්‍රහය යටතේ පත්කර ඇති කමිටුවක් විසින් මෙම අරමුණ සපුරා ගැනීම සඳහා අවශ්‍ය මැදිහත්වීම් පහක් හඳුනා ගන්නා ලදී. හැටන් නැෂනල් බැංකුවේ ප්‍රධාන මානව සම්පත් නිළධාරී, චිරන්ති කුරේ විසින් කමිටුවේ ප්‍රධානත්වය දරණ ලද අතර පහත සඳහන් පුද්ගලයින් ඒ සඳහා සහභාගි විය.

| | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 1 | මහාචාර්ය දිලිනි ගුණවර්ධන මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| 2 | ආචාර්ය නිශා අරුණතිලක මිය | අධ්‍යක්ෂ -පර්යේෂණ | ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය |
| 3 | ආචාර්ය රමණී ගුණතිලක මිය | ස්වාධීන උපදේශක | ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ හිටපු ආර්ථික විද්‍යාඥ |
| 4 | එස්.එම්. ගෝඨාභය ජයරත්න මයා | හිටපු ලේකම් | කම්කරු හා වෘත්තීය සමිති සම්බන්ධතා අමාත්‍යාංශය |
| 5 | සුනිල් අබේවර්ධන මයා | රාජ්‍ය ලේකම් | කම්කරු හා වෘත්තීය සමිති සම්බන්ධතා අමාත්‍යාංශය |
| 6 | ජේ.ඒ.පී. ජයසිංහ මිය | අධ්‍යක්ෂ සැලසුම් | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය |
| 7 | පද්මිනි රත්නායක මිය | අමාත්‍ය උපදේශක | විදේශ රැකියා අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 8 | මහාචාර්ය ප්‍රීති උඩුගම | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කොළඹ විශ්ව විද්‍යාලය |
| 9 | ආචාර්ය බී.ඩබ්.ආර්.දමයන්ති මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| 10 | එච්.ජී.ජී.ජේ. ධර්මසේන මයා | අධ්‍යක්ෂ ජනරාල් | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව |
| 11 | ඒ. විමලවීර මයා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | කම්කරු හා වෘත්තීය සමිති සම්බන්ධතා අමාත්‍යාංශය |
| 12 | පී. මහාදේව් මයා | කම්කරු කොමසාරිස් | කම්කරු දෙපාර්තමේන්තුව |
| 13 | මුර්තාසා එසුෆලි මයා | සමූහ අධ්‍යක්ෂ | හේමාස් සමූහය |
| 14 | අර්ජුන හේරත් මයා | ජ්‍යෙෂ්ඨ සහකරු | අර්නස්ට් ඇන්ඩ් යන්ග් |
| 15 | ගයානි ද අල්විස් මිය | සභාපති | විමෙන් ඉන් ලොජිස්ටික්ස් ඇන්ඩ් ට්‍රාන්ස්පෝට් |
| 16 | අලිකි පෙරේරා මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | ලංකා වාණිජ මණ්ඩලය |
| 17 | අරෝෂි නානායක්කාර මිය | ප්‍රධාන විධායක අධ්‍යක්ෂ | ගෝලීය උපදේශන සමාගම |
| 18 | අයෝමි ප්‍රනාන්දු මිය | සහකාර අධ්‍යක්ෂ ජනරාල් | ලංකා කම්කරු සංගමය |
| 19 | ෂිරෝමාල් කුරේ මිය | කළමනාකාර අධ්‍යක්ෂ | ජෙට්වින් ට්‍රැවල් /සභාපති, *SLID* |
| 20 | ආචාර්ය රුවන්ති ද සිල්වා මිය | නිර්මාතෘ /ප්‍ර.වි.නි. | *SCM PLUS* පුද්ගලික සමාගම |
| 21 | එරන්ති ප්‍රේමරත්න මිය | සාමාන්‍යාධිකාරි | *MAS* |
| 22 | උපුල්කා මුණසිංහ මිය | මානව සම්පත් ප්‍රධානී | හේමාස් |
| 23 | කැතරින් වීරක්කොඩි මිය | ආයෝජන විශ්ලේෂක | AIA ඉන්ෂුවරන්ස් |
| 24 | මහාචාර්ය රංගික හල්වතුර මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | මොරටුව විශ්ව විද්‍යාලය |

මෙම පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා මැදිහත්වීම් අවශ්‍ය වන ප්‍රධාන අංශ පහක් කාර්යය බලකාය විසින් හඳුනාගෙන තිබේ.

- ❖ ජාතික ප්‍රතිපත්තිය සහ කම්කරු නීති ප්‍රතිසංස්කරණ
- ❖ මානව සම්පත් ප්‍රතිපත්ති මැදිහත්වීම රාජ්‍ය සහ පෞද්ගලික අංශ
- ❖ කාන්තාවන් වැඩිපුර කුලියට ගැනීම සඳහා පුද්ගලික අංශය දිරිගැන්වීම
- ❖ ජනමාධ්‍ය හරහා මහජන විවාද තුළින් සමාජ සංවේදීතාවය
- ❖ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

ඉහත ක්ෂේත්‍ර යටතේ සිදුකරන ලද නිර්දේශ පහත පරිදි වේ.

1. **ජාතික ප්‍රතිපත්තිය සහ කම්කරු නීති ප්‍රතිසංස්කරණ**

❖ ILO-C183 සමග අනුකූලව මාතෘත්ව පිරිවැය රජය සහ සේවා යෝජකයා අතර හවුලේ බෙදා ගැනීම පිණිස රක්ෂණ අරමුදලක් පිහිටුවීම

❖ සාප්පු හා කාර්යාල පනතෙහි "කාර්මික ව්‍යාපාර" යන යෙදුමේ විෂය පථය පුළුල් කිරීම

❖ අර්ධකාලීන, සුනම්‍ය පැය, නිවසේ සහ අතථ්‍ය විධිවිධාන සඳහා නිශ්චිත අයිතියක් සහ ප්‍රතිලාභ නිර්ණය කිරීම සඳහා නීති / සංශෝධන / වගන්ති හඳුන්වා දීම.

2. **මානව සම්පත් ප්‍රතිපත්ති මැදිහත්වීම රාජ්‍ය සහ පෞද්ගලික අංශ**

❖ ශ්‍රී ලංකා රජය සහ ලංකා වාණිජ මණ්ඩලය සහ ලංකා සේවක සම්මේලනය විසින් අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමක් හරහා පෞද්ගලික - රාජ්‍ය මනා පරිචයන් ජාලය හුවමාරු කර ගැනීමේ ජාලයක් ස්ථාපිත කිරීම.

❖ බලපෑමට ලක් වූ කාන්තාවන් සම්බන්ධ අපකීර්තිය අවම කර ගැනීම සහ දුක් ගැනවිලි පහසුවෙන් ඉදිරිපත් කිරීම සඳහා පහසු මාර්ගයක් නිර්මාණය කිරීම.

❖ ශ්‍රී ලංකාවේ පුද්ගලික අංශයේ සමාගම් තුළ ස්ත්‍රීපුරුෂභාවය පදනම්ව ගෙවීම් සමානතා අධ්‍යයනය කිරීම.

3. **කාන්තාවන් වැඩිපුර සේවයේ යොදවා ගැනීම සඳහා පුද්ගලික අංශය දිරිගැන්වීම**

❖ යටිතල පහසුකම්, විශේෂ හෝටල් සහ මධ්‍ය ප්‍රමාණයේ මෝටර් රථ භාවිත කරමින් කාන්තාවන් සඳහා පමණක් ප්‍රවාහන පහසුකම් ලබාදීම.

❖ නිවසේ සිට වැඩකිරීම සඳහා දක්ෂ කාන්තාවන් වෙනුවෙන් බාහිර සේවා ලබාගැනීම සඳහා මධ්‍ය නියෝජිතයෙක් ලෙස කටයුතු කිරීමට මාර්ගගත රැකියා සැපයුම් සමාගමක් ඇති කිරීම

4. **ජනමාධ්‍ය හරහා මහජන විවාදයන් තුළින් සමාජ සංවේදීතාවය**

❖ අධ්‍යාපන විෂයමාලා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම. ද්විත්ව ආදායම් උපයන පවුල් සඳහා පාසල් පෙළ පොත්

❖ ස්ත්‍රී පුරුෂ ඒකාකෘතභාවයන්ට අදාළ සංස්කෘතික ප්‍රතිමාන, හිංසන ගැටලුව සහ සේවා ස්ථානවල කොන් කිරීම හා වැඩකරන කාන්තාවන් මුහුණ පාන වැඩවල ද්විත්ව බර යනාදිය ආමන්ත්‍රණය කිරීම සඳහා ජනමාධ්‍ය -මුද්‍රිත, රූපවාහිනී, ගුවන් විදුලිය, ටෙලි නාට්‍ය, චිත්‍රපට, සාකච්ඡාමය වැඩසටහන්, පුවත් ලිපි යනාදිය යොදා ගැනීම.

❖ සම්මාන වැඩසටහන්වලදී කාන්තාවන්ගේ කාර්යභාර රටාවන් ප්‍රදර්ශනය කිරීම (උදා: ජාතික ඵලදායී සම්මාන, විශිෂ්ඨතම ආයතනික පුරවැසි සම්මාන)

**5. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ**

- ❖ විශ්ව විද්‍යාලවල සහ TVET අංශය තුළ බඳවාගැනීම සඳහා කාන්තාවන්ට වැඩි අවස්ථා
- ❖ ඉහළ අධ්‍යාපනය ලබාගැනීම සඳහා අධ්‍යාපන ණය කරා ප්‍රවේශය
- ❖ ජංගම අධ්‍යාපනික යෙදුම් මඟින් කාන්තාවන්ට වැදගත් නිපුණතා සහ මූල්‍ය සාක්ෂරතාව, කළමනාකරණය සහ නායකත්ව ක්‍රමෝපායන් වැනි කාන්තාවන්ට වෙනත් ආකාරයෙන් පිවිසිය නොහැකි සම්පත් පිළිබඳ පුහුණුව සහ සහය ජාලයක් ලබාදිය හැක.

වාර්තාව අවසන් කිරීමෙන් පසු, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව විසින් 'තරුණකම, එඩිතරකම සහ ධෛර්යය - සුපෝෂිත රටක් සඳහා තරුණ ව්‍යවසායකයින්ගේ ජීවය' නමින් සාකච්ඡා සංසදයක් සහ වැඩමුළුවක් බණ්ඩාරණායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී නොවැම්බර් 02 දින පෙරවරු 8.30ට පවත්වනු ලැබීය. මෙම වැඩසටහනින් තරුණ ව්‍යවසායකයින්ට ලබාගත හැකි අවස්ථාවන් පිළිබඳ විශේෂයෙන් ව්‍යාපාර ආරම්භ කරන, අභියෝගවලට මුහුණ පාන කාන්තාවන්ට ඒවා ජයගන්නා ආකාරය පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම අරමුණු කරන ලදි. ඉන්දියාවේ සාර්ථක තරුණ ව්‍යවසායකයෙක් වන, අන්ජනා රෙඩී සංසදයේ ප්‍රධාන කථිකයා වේ. රෙඩී රුපියල් 100 කෝටි ව්‍යාපාරයක් වන යුනිවර්ෂල් ස්පෝර්ට්ස්බිස් ලිමිටඩ් හී නිර්මාතෘ වේ. ආසියාවේ 30 ලැයිස්තුව යටතේ පෝර්බ්ස් 30 තුළ ඉහළම ඊ වාණිජ්‍ය හා සිල්ලර ව්‍යවසායකයින් 30ස් දෙනා අතරට මෑතකදී ඇයද එක්විය. ප්‍රධාන කථිකාවට පසු තරුණයින්, අපේක්ෂිත වෘත්තිකයින් සහ ව්‍යවසායකයින් ඉලක්ක කර ගනිමින් මණ්ඩල සාකච්ඡාවක් සහ වැඩමුළුවක් පැවැත්වේ. මෙම මණ්ඩලයට කොකා කෝලා ශ්‍රී ලංකා කළමනාකාර අධ්‍යක්ෂ, සෝනු ග්‍රවර්, ස්පා සිලෝන් සම නිර්මාතෘ සලීන් බාලසූරිය, ඩෙයිලි එෆ් ටී සංස්කාරක, නිස්තාර් කාසීම්, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයෙහි (SLITHM) සභාපති සුනිල් දිසානායක ඇතුළත් වූ අතර මෙම සැසිය හැටන් නැෂනල් බැංකුවේ ප්‍රධාන මානව සම්පත් නිලධාරී ක්‍රිෂාන්ත කුරේ විසින් මෙහෙයවන ලදි.

සභාවේ සභාපති, දිනේෂ් වීරක්කොඩි මහතා විසින් "ශ්‍රී ලංකාවේ පුද්ගලික අංශය තුළ කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වය වැඩි කිරීමේ මාර්ග සිතියම" පිළිබඳ වාර්තාවේ පළමු පිටපත අග්‍රාමාත්‍ය කාර්ය මණ්ඩල නියෝජ්‍ය ප්‍රධානී සහ හිටපු ඇමතිනි රෝසි සේනානායක මහත්මිය වෙත පිළිගන්වනු ලැබීය.





## 5.2 තාක්ෂණික අංශය සඳහා පුහුණු ශ්‍රමිකයින්

මෙම වැඩසටහන දත්ත විද්‍යා වැඩසටහන් තුළ අවුරුදු 5ට වැඩි තරුණයින් 1000ක් බිහි කිරීම සඳහා වර්ධිත පුහුණු වැඩසටහනක් ලෙස කර්මාන්ත දියත් කිරීමේදී හවුල්වීම සඳහා පවත්වන ලදි. මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ අවස්ථා සහ ඉදිරි පස් වසරේදී දත්ත විද්‍යා තාක්ෂණය තුළ තරුණයින් 1000 ක් බිහි කිරීමත්, අදාළ ආයතන සමඟ ඉදිරි පස් වසර සඳහා නව දත්ත විද්‍යා වැඩසටහන් දියත් කර වර්ධනය කිරීමත්ය.

ICT දත්ත විද්‍යා කර්මාන්ත නියෝජිතයෙක් සමඟ 2017 අගොස්තු 9 දින, අගෝස්තු 24 දින හා සැප්තැම්බර් 14 දින සාකච්ඡා තුනක් පවත්වනු ලැබූ අතර සංකල්ප පත්‍රිකාවක් සංවර්ධනය කර ඇත. මෙම සාකච්ඡාවේදී ලබාගත හැකි තොරතුරු හුවමාරුකර ගත් අතර, වාර්තාව සකස් කිරීම ආරම්භ කරන ලදි.

## 5.3 මැදපෙරදිග සිට ආපසු පැමිණෙන්නන් නැවත මෙහෙයවීම සඳහා ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ උපදේශකත්වයෙන් ක්‍රමෝපායක් ක්‍රියාත්මක කිරීම

මැද පෙරදිග සිට ආපසු පැමිණෙන සංක්‍රමණිකයින් නැවත මෙහෙයවීම, ආපසු පැමිණෙන්නන් සඳහා අවස්ථා නිර්මාණය කිරීම සහ පුහුණු ලබාදීම සඳහා රාජ්‍ය හා පුද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් සම්බන්ධ කිරීම මෙම වැඩසටහනේ පරමාර්ථය වේ.

දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් එනම් 2017 සැප්තැම්බර් 13 දින වත්තල නගර ශාලාවේදීත් අනෙක් වැඩසටහන 2018 නොවැම්බර් 21 දින මීගමුවේදීත් පවත්වන ලදි. මෙම වැඩසටහන් වෘත්තීය අභිප්‍රේරණය, වෘත්තීය පුහුණුව සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ශක්තිමත් කිරීම සඳහා සැලසුම් කරන ලදි.

### 5.3.1 වත්තලදී පැවැත්වූ රැකියා පොළ සහ වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන

NHRDC විසින් "අනාගතයට සූදානම් ශ්‍රම බලකාය" යන දැක්ම සහිතව පාසල් හැරයන්නන් සඳහා දෙවන වෘත්තීය දැනුවත් කිරීමේ වැඩසටහන සහ වෘත්තීය පොළ වැඩසටහන ගම්පහ දිස්ත්‍රික්කය තුළ සංවිධානය කරන ලදි. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව විසින් විදේශ රැකියා අමාත්‍යාංශයේ විදේශ රැකියා කාර්යාංශයේ ලේකම් සමඟ සාකච්ඡා කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාව තුළ ඉහළම සංක්‍රමණය සම්බන්ධ දිස්ත්‍රික්ක හඳුනාගනු ලැබීය. ඒවානම් කුරුණෑගල, ගම්පහ, මඩකලපුව සහ පුත්තලම වේ. අප විසින් වැඩසටහන් දෙකක් එනම් වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ ගම්පහ දිස්ත්‍රික්කය තුළ පැවැත්වීමට සැලසුම් කරන ලදි.

පළමු දැනුවත් කිරීමේ වැඩසටහන වත්තලදි පවත්වනු ලැබීය. වත්තල, මහර සහ ජා ඇල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල රැකියා, වෘත්තීය පුහුණු අධ්‍යාපනය සොයන්නන් සහ මැදපෙරදිග සිට එන

සංක්‍රමණිකයන් මෙයින් ඉලක්ක කරන ලදි. මෙම වැඩසටහන වෘත්තීය අභිප්‍රේරණය සහ වෘත්තීය පුහුණුව සහ රැකියා පොළ සඳහා සැලසුම් කරන ලදි. පළමු වැඩසටහන තුළ, ටස්මා ඉන්ටර්නැෂනල්, එයිට්කන් ස්පෙන්ස්, හේලීස් පුද්ගලික සමාගම, මැස් හෝල්ඩින්ග්, ලීඩර් ට්‍රැවල්ස් සහ ටුවර්ස්, ආර්පිකෝ පුද්ගලික සමාගම, සදාහරිත ප්ලාන්ටේෂන් වැනි පුද්ගලික ආයතන සහභාගී වූහ. VTA, NAITA සහ SME අංශයේ නියෝජිතයින් ඔවුන්ගේ අවස්ථා සහ ඔවුන්ගේ වෘත්තීය පුහුණු වැඩසටහන් හඳුන්වා දෙන ලදි.

ධනුක සිරිනාම මහතා අභිප්‍රේරණ පිළිබඳ සැසියක් පැවැත්වූයේය. ඔහු බොහෝ දේශීය රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන්වලට සහභාගී වී ඇති අතර පුද්ගලික සමාගම් කිහිපයක උපදේශකවරයෙක් ලෙසද සේවය කරයි. සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ පුද්ගලික ලේකම් විසින් වැඩසටහන පිළිබඳ විස්තර කරන ලද අතර TVEC ආයතනයේ අධ්‍යක්ෂ, මංජුල විදානපතිරණ මහතා තෘතීයික වෘත්තීය සහ අධ්‍යාපන වැඩසටහන පිළිබඳව විස්තර කළේය. මෙම වැඩසටහනට කාන්තාවෝ 300ක් පමණ සහභාගී වූහ. සංක්‍රමණිකයින් නැවත මෙහෙයවීමේ වැඩසටහන වත්තල නගර සභා රැස්වීම් ශාලාවේදී 2017 අගෝස්තු 13 දින පවත්වන ලදි.





**5.3.2 මීගමුවේදී පැවැත්වූ වෘත්තීය පොළ සහ වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන**

පාසල් හැරයන්නන් සඳහා කර්මාන්ත/ සමාගම්වල පවත්නා රැකියා අවස්ථාවන් සහ රාජ්‍ය හා පුද්ගලික අංශය තුළ ලබාගත හැකි නිපුණතා පුහුණු වැඩසටහන් සහ රැකියා පොළ පිළිබඳ දෙවන දැනුවත් කිරීමේ වැඩසටහන මීගමුවේදී පවත්වා ඇත. මෙම වැඩසටහනින් කර්මාන්ත සේවායෝජකයින් වෙත පාසල් හැරගිය තරුණයින්ට ඔවුන් පිළිබඳ හඳුන්වාදීමත් කර්මාන්ත අවස්ථා පිළිබඳ පාසල් හැරගිය තරුණයින් දැනුවත් කිරීමට අවස්ථාව ලබාදීමත් සහ කර්මාන්ත සේවා යෝජකයින් සමඟ ජාලගතවීමට පාසල් හැරගිය තරුණයින්ට අවස්ථාව ලබාදීමත් මෙම වැඩසටහනින් අරමුණු කරන ලදි.

මෙම වැඩසටහනින් මීගමුව, මිනුවන්ගොඩ, කටාන, ගම්පහ, වත්තල, මහර සහ ජා ඇල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාශවල රැකියා සොයන්නන් සහ 2016 දී විභාගයට පෙනී සිටි පාසල් හැරගිය තරුණයින්, වෘත්තීය පුහුණු අධ්‍යාපනය හැදෑරීමට කැමත්තක් දක්වන්නන් සහ මැදපෙරදිග සිට පැමිණි

සංක්‍රමණිකයින්ද ඉලක්කගත කරන ලදි. රැකියා පොළ පැවැත්වීමේ අරමුණ වන්නේ අවිධිමත් ආකාරයෙන් අනාගත රැකියා අපේක්ෂකයින් හමුවීමට ආයතනවලට ඉඩ ලබාදීමයි. රැකියා පොළ තුළින් රැකියා සොයන්නන්ට විභව සේවායෝජකයින් සහ ලබාගතහැකි අවස්ථා පිළිබඳ වැඩිදුර තොරතුරු ලබාගැනීමට අවස්ථාව සැලසේ. මින් අවධානය යොමුකරන්නේ සමාගම්, පුහුණුව ලබාදෙන්නන් සහ රැකියා සොයන්නන් අතර තොරතුරු හුවමාරු කරගැනීමයි. මෙය එක් ස්ථානයකදී විවිධ සමාගම්වල රැකියා අවස්ථා ගවේෂණය කිරීමේ මාර්ගයකි. ආයතනික සීමාවාසිකත්ව, රැකියා ස්ථාපනය සහ රැකියා තොරතුරු කරා පිවිසීමට තරුණයින් සඳහා අවස්ථාව ලබාදීමට රැකියා පොළ සංවිධානය කළ අතර එමගින් තරුණ ජනතාව සහ සමාගම් අතර මනා සම්බන්ධතා ගොඩනැගීමට හේතු විය.

මෙවැනි අවස්ථාවන්ට අනුග්‍රහය දැක්වීම තුළින් ධනාත්මක බඳවාගැනීම සහ ස්ථාපන සාර්ථකත්වයන් සුරක්ෂිත කිරීමේදී සමාගම් සහ තරුණ ජනතාවට සහයවන බව අපගේ අදහස වේ. මෙවැනි තරුණයින්ගේ දක්ෂතාව සහ විශ්වාසය සමාගම තුළ තනතුරු සඳහා අවශ්‍ය ඉල්ලුම සපුරාලනු ඇත. මෙම අවස්ථාවට සහභාගිවීම සහ දක්ෂතා අදාළත්වය සහ මෙම අවස්ථාවේදී ලබාගතහැකි ගැළපෙන පාඨමාලා පිළිබඳ දැනගැනීමට හැකිවීම වෙනුවෙන් කිසිදු ගාස්තුවක් සේවා යෝජකයාගෙන් අය නොකරයි.

මෙම අවස්ථාවට සිසුහු 700ක් පමණ සහභාගි වූහ. කර්මාන්ත රැකියා පොළ මීගමුව නගර සභා ශ්‍රවණාගාරයේදී 2017 නොවැම්බර් 21 දින පැවැත්වූ අතර ගම්පහ දිස්ත්‍රික් ලේකම්, සුනිල් ජයලත් මහතා NHRDC සම්බන්ධීකරණය සහ එම කටයුතු දිරිමත් කරමින් මෙහි අරමුණ පැහැදිලි කළේය. නාගරික කොමසාරිස් විසින් ශ්‍රී ලංකාවේ වර්ධනය වන කර්මාන්තගත රැකියා අවස්ථා සහ දක්ෂතා පරතරය පිළිබඳ සඳහන් කරමින් NHRDC ව්‍යාපෘති දිවයින පුරා පැවැත්වීමට දිරිමත් කරන ලදි.

ධනුක සිරිනාම මහතා අභිප්‍රේරණ පිළිබඳ දේශකයා වූ අතර ඔහු අභිප්‍රේරණ සැසියක් පැවැත්වූයේය. ඔහු විසින් ''තරුණයින් රැකියාවක් සොයන්නේ ඇයි', 'අපිට රැකියාවක් අවශ්‍ය ඇයි', අපි රැකියාවක් සොයන ආකාරය', සහ පුද්ගලික සමාගම් සහ සේවායෝජකයාගේ අවශ්‍යතා මොනවාද' යන මාතෘකාවන් පිළිබඳ පැහැදිලි කරන ලදි. සහභාගිවූ බහුතරයක් අදාළ රැකියාව පිළිබඳ අදහසක් ලබාගත්හ. ඔහු පුද්ගලික අංශය තුළ වෘත්තීය ගමන්මග පිළිබඳ පැහැදිලි කළේය.

නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ වෘත්තීය මාර්ගෝපදෙශන නිලධාරී චන්දිමා රොද්‍රිගෝ මහත්මිය ''වෘත්තීය පුහුණු වැඩසටහන් සහ තරුණයින් සහ මෙරටට පැමිණි සංක්‍රමණිකයින් සඳහා පුහුණු අවස්ථා'' යන තේමාව යටතේ අදහස් දැක්වූවාය. සුමුදු පාගොඩ මිය අධ්‍යක්ෂ -මෙහෙයුම් (කළමනාකරණය පිළිබඳ සහතිකලත් ගිණුම්කරණය) විසින් ඔවුන්ගේ පුහුණු වැඩසටහන් සහ පාඨමාලා පිළිබඳ පැහැදිලි කළාය.

මෙම අවස්ථාවට 800ක් පමණ සහභාගි වූ අතර ඔවුහු විවිධ වයස් කාණ්ඩවලට අයත් වූහ. එයිට්කන් ස්පේන්ස්, එම්පීඑල් සමූහය, මැක්ඩොනල්ඩ්ස්, හයිඩ්‍රාමානි, මැස් හොල්ඩින්ග්ස්, පොලිටෙක් ගාමන්ට්, යූනියන් ඇසුවරන්ස්, කොකු ලංකා පුද්ගලික සමාගම, සීඅයිබී, ආර්පිකෝ වැනි පුද්ගලික සමාගම් 23ක් හා VTA, NAITA, DTET, NYSC, SLITHM සහ CMA යන ආයතන සහභාගි වූහ. විවිධ කර්මාන්ත නියෝජිතයින් සහභාගි වූ අතර, ඔවුන්ගේ ඇබෑර්තු සහ අවස්ථාවන් ප්‍රදර්ශනය කරන ලදි. ඒවා ප්‍රධාන වශයෙන් ඇපරල් කර්මාන්තය, ඇඟලුම්, ආහාර සහ බීම, නිෂ්පාදන කර්මාන්ත, රක්ෂණ කර්මාන්තය, වැවිලි කර්මාන්තය, මානව සම්පත්, සංචාරක සහ හෝටල් කර්මාන්තය, ඉදිකිරීම් හා මෝටර්රථ යනාදී වශයෙනි.

NHRDC *විසින්* ගම්පහ දිස්ත්‍රික් ලේකම්, වෘත්තීය සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය, මිනිස්බල හා රැකියා අමාත්‍යාංශය, කාන්තා කටයුතු අමාත්‍යාංශය, හාම්පුතුන්ගේ සංගමය, ජාතික වාණිජ මණ්ඩලය, ලංකා වාණිජ මණ්ඩලය. ජාතික සහ දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය හා පුද්ගලික වෘත්තීය පුහුණු ආයතනවල සහයෝගීත්වයෙන් මෙවැනි වැඩසටහන් සම්බන්ධීකරණය කර ඇත.

Negombo Programme



| | සමාගම/ ආයතනයේ නම | පවත්නා ඇබෑර්තු ගණන | සම්මුඛ පරීක්ෂා කළ සහභාගිකයින් ගණන |
|---|---|---|---|
| 01 | සීඅයිබී සොපින් සෙන්ටර් මීගමුව | 20 | 38 |
| 02 | ට්‍රිනිටි ස්ට්‍රීට් පුද්ගලික සමාගම | 40 | 15 |
| 03 | මැරිටයිම් ප්ලේස්මන්ට් | 160 | 28 |
| 04 | ඇෂුවරන්ස් | 50 | 50 |
| 05 | ඩීසල් ඇන්ඩ් මෝටර් ඉංජිනියරින් (පීඑල්සී) | 10 | 0 |
| 06 | ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී | 20 | 77 |
| 07 | කොහොකු ලංකා පුද්ගලික සමාගම | 100 | 18 |
| 08 | මැක්ඩොනල්ඩ්ස් | 30 | 28 |
| 09 | එයිට්කන් ස්පේන්ස් | 50-70 | 02 |
| 10 | සදාහරිත ප්ලාන්ටේසන්ස් | 35 | 30 |
| 11 | සිද්ධාලේප | 08 | 03 |
| 12 | ලංකා ගාමන්ට් | 30 | 0 |
| 13 | ස්මාර්ට් ෂර්ට්ස් | 200 | 0 |
| 14 | බ්‍රැන්ඩික්ස් | 50 | 0 |
| 15 | හයිඩ්‍රාමනී මර්කරි ඇපරල් කටුනායක | 35 | 02 |
| 16 | මවුන්ටා ප්‍රොඩක්ට්ස් පුද්ගලික සමාගම | 25 | 17 |
| 17 | සෙන්වෙක් ලබාන පුද්ගලික සමාගම | 10 | 20 |
| 18 | හයිලන්ඩ් ෆයිල්ස් පුද්ගලික සමාගම | 50 | 25 |
| 19 | ටන්ට්‍රික් ටෙයිලර්ස් පුද්ගලික සමාගම | 100 | 7 |
| 20 | සෙල්කෝ කොන්ටිනන්ටල් පුද්ගලික සමාගම | 100 | 40 |
| 21 | යුනිවර්ෂල් කොලේජ් ඔෆ් ලර්නින්ග් | 500 | 35 |
| 22 | නොර්ත් මනුෆැක්චරින් පුද්ගලික සමාගම | 20 | 5 |
| 23 | ආර්පිකෝ සුපර් (රිචර්ඩ් පීරිස්) | 100 | 60 |
| 24 | ඔඩෙල් පීඑල්සී (සොෆ්ට්ලොජික්) | 50 | 20 |
| 25 | VTA (පුහුණු) | 350 | 14 |
| 26 | ඩාල් ටෙක්ටයිල්ස් ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම | 50 | 30 |
| 27 | සීඑම්ජ් ඉන්ස්ටිටියුට් කොළඹ 4 | | 2 |
| 28 | ඔකායා ලංකා | 100 | 40 |
| 29 | වෘත්තීය පුහුණු අධිකාරිය | 15 | 15 |
| 30 | හයිඩ්‍රාමනී ටෙක්ටයිල් පුද්ගලික සමාගම | 40 | 30 |
| 31 | පොලිටෙක්ස් ගාමන්ට් ලිමිටඩ් | | 23 |
| 32 | හෙට්ටිගෝඩ ගෘප් පුද්ගලික සමාගම | | 10 |
| 33 | මිනිස්බල හා රැකියා දෙපාර්තමේන්තුව | 100 | *ඔවුන්ගේ දත්ත පද්ධතියට ඇතුළත් කර ඇත.* |
| 34 | NAITA -ගම්පහ | පුහුණුව සඳහා | 12 |

## 5.4 TVEC සමඟ සහයෝගීත්වයෙන් NVQ ක්‍රමය තුළින් TVET (සංචාරක අංශය) තුළ තත්ත්ව සහතික වර්ධනය

සංචාරක කර්මාන්තයේ අනාගත සේවක අවශ්‍යතා කෙටි කාලීනව තක්සේරු කිරීමට සහ ඒ සමඟම රට තුළ සංචාරක කර්මාන්තය සඳහා ලබාගත හැකි පුහුණු පහසුකම් ඇගයීමටද පුහුණු පරතර ක්‍රමවත් කිරීමටද අදාළ වගකීම මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව (NHRDC) වෙත පවරන ලද්දේ ගරු අග්‍රාමාත්‍යවරයා විසිනි.

NHRDC හි සභාපති දිනේෂ් වීරක්කොඩි මහතාගේ උපදෙස් පරිදි, කමිටු දෙකක් ස්ථාපිත කරන තිබේ. ඒ අනුව ශ්‍රීලාල් මිත්තපාල මහතාගේ නායකත්වයෙන් ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ වර්ධන ඉලක්ක සපුරාලීමට පුහුණු සේවකයින් සඳහා කර්මාන්තයේ සැබෑ ඉල්ලුම ඇගයීමට සහ පුරෝකථනය කිරීම සඳහා එක් කමිටුවත් පත්කළ අතර, සුනිල් දිසානායක මහතාගේ නායකත්වයෙන් ශ්‍රී ලංකාවේ සියලුම සංචාරක පුහුණු ආයතනවල තත්ත්වය සහ ප්‍රමිතිය නිශ්චය කිරීම සඳහා දෙවන කමිටුව පත්කර තිබේ.

මෙම කමිටු දෙකේ සොයාගැනීම් මත පදනම් වී, ‘සංචාරක කර්මාන්තයේ අනාවැකි 2016-2020’ නමින් ආචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙනිය විසින් වාර්තාවක් සම්පාදනය කර ගරු අගමැතිතුමා වෙත ඉදිරිපත් කිරීම සඳහා NHRDC හි සභාපති වෙත භාර දෙන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස, NHRDC ආයතනය පහත පරිදි මෙම වාර්තාව තුළ දක්වා ඇති කරුණු ආමන්ත්‍රණය කිරීම සඳහා ක්‍රියාත්මක සැලැස්ම සකස් කරමින් සිටියි.

- ❖ සංචාරක කර්මාන්තයට එක්වීම සඳහා තරුණ ජනතාව ආකර්ෂණය කරගැනීමේ මාර්ග සහ ආකාර සඳහන් කරමින් පැහැදිලි කාර්ය සැලැස්මක් සකස් කිරීම
- ❖ සංචාරක කර්මාන්තය සඳහා නව කාර්ය මණ්ඩල ඉල්ලුම සපුරාලීමට පුහුණු හා සංවර්ධන සැලැස්මක් සකස් කිරීම.

ක්‍රියාකාරි කමිටු දෙකේ පළමුවැන්න මනෝසේකරම් මහතාගේ නායකත්වයෙන්ද, දෙවැන්න චන්ද්‍රා මොහොටේටිගේ මහතාගේ නායකත්වයෙන්ද පිහිටුවනු ලැබීය.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වූයේ :

- ❖ වැදගත් වර්ධන කර්මාන්ත සඳහා දක්ෂයින් සැපයීම වැඩි කිරීම.
- ❖ සංචාරක කාර්යය බාලකායන් දෙකක් ස්ථාපිත කිරීම සහ කර්මාන්තයේ අපේක්ෂිත අදහස්, යෝජනා සහ යෙදවුම් විශ්ලේෂණය කිරීම.
- ❖ සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයට භාරදීම සඳහා යෝජනාවක් සංවර්ධනය කිරීම.

වෘත්තීය සංවර්ධන සහ වෘත්තීය පුහුණු සහ සංචාරක සංවර්ධන අමාත්‍යාංශය සංචාරක කර්මාන්තය සඳහා නිපුණතා සභාවක් පිහිටුවා ඇති අතර, එය සම්පූර්ණයෙන් පිහිටුවා විධිමත් පරිදි සම්පත් යෙද වූ පසු, සංචාරක කර්මාන්තය, සංචාරක සහ ආගන්තුක සත්කාරය තුළ වැඩ කරන ජනතාව සුදුසු පරිදි පුහුණු

කරන බව සහතික කිරීම නිපුණතා සභාව වෙත පැවරිය යුතු අතර ඔවුන්ගේ පළපුරුද්ද යොදා ගැනීම තුළින් තිරසාර, ඵලදායී සහ ලාභ ලැබියහැකි සංචාරක කර්මාන්තයක් කරා පරිවර්තනයවීමට හැකි වේ. එසේවුවත්, යෝජිත මැදිහත්වීම ක්‍රියාත්මක කිරීම සඳහා කර්මාන්තයට පුහුණුව ලබාදෙන්නන් සහ රජය හා එක්ව කටයුතු කිරීම අවශ්‍ය වේ. එවැනි සහයෝගී ප්‍රවේශයක් තුළින් පමණක් සංචාරක සහ ආගන්තුක සත්කාර කර්මාන්තයට නිවැරදි අවස්ථාවේ නියම දක්ෂතා සහිත සැබෑ මිනිසුන් පිවිසීම සහතික කළ හැකිය.

සංචාරක, ගමනාගමන හා ආගන්තුක සත්කාර කර්මාන්තය තුළ පෙරනොවූ විරූ වර්ධනය හේතු කොට ගෙන, සුදුසුකම් සහිත හා පුහුණු ශ්‍රමය පිළිබඳ තීරණාත්මක අඩුපාඩුවක් පවතී. අනාගත ශ්‍රම බලාකාය පිළිබඳ රැකියා අනාවැකිවලදී මෙම රටාව තවදුරටත් පවත්නා බව දැඩිව සඳහන් කිරීම අවශ්‍ය වේ. කර්මාන්තය අඛණ්ඩව වර්ධනය වන බැවින්, මෙහෙයුම් ඵලදායිතාව සහ තිරසාරත්වය සංචාරකයින්ගේ අපේක්ෂාවන් ප්‍රමිතිගතව සපුරාලීමට සමත්වන බව සහතික කිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට සුදුසු පුහුණු කාර්ය මණ්ඩලය කර්මාන්තය කරා පිවිසීමට හැකිවීම පිණිස මිනිස්බලය සැලසුම් කිරීම අවශ්‍ය වී ඇත. 2020 වනවිට සංචාරක ක්ෂේත්‍රය තුළ පුහුණු සඳහා ඇතුළත්වීම 32,793ක් ලෙස තක්සේරු කරනු ලැබුවත් දැනට වාර්ෂික හැකියාව 8,599ක් පමණ වේ.

ලියාපදිංචි පුහුණු ආයතන සංඛ්‍යාව තුළින් හෝ අවම වශයෙන් කලාපීය ප්‍රමිති හා ගැලපියයුතු නව ආයතන තුළින් හෝ අදාළ පරතරය පිරවිය යුතු වේ. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ (SLITHM) ඉලක්කය 8000 ක් වුවද 2016 සහ 2017 දී පිටවීම 5178 ක් විය. ඉක්මන් අවධානය යොමුකළ යුතු ක්ෂේත්‍රයක් වන්නේ යෝග්‍ය පුහුණුකරුවන්ගේ අවශ්‍යතාවය සහ කළමණාකාරිත්ව හැකියා ගොඩ නැංවීම කෙරෙහි දැඩි අවධාරණය සහිතව විකුණුම් හා අළෙවිය, හෝටල් මූල්‍ය, ERP සහ ප්‍රසම්පාදනය යනාදිය වැනි දැනට පිරිනොනමන ආගන්තුක සත්කාර විෂයමාලා තුළ නව විනය හඳුන්වාදීමයි. සංචාරක, සංචාර සහ ආගන්තුක සත්කාර සුදුසුකම් සඳහා අවම සම්පූර්ණ කිරීමේ අනුපාත කර්මාන්තයට දිගුකාලීන ගැටලුවක් බවට පත්ව ඇතත් නව වැඩසටහන් රාශියක් මඟින් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු (VET) ක්‍රමය සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් වර්ධනය කිරීමට කටයුතු කර ඇත.

**පහත දෑ ආමන්ත්‍රණය කිරීම සඳහා විශේෂ නිර්දේශ සිදුකිරීමට කමිටුවට බලය පවරා ඇත.**

- ❖ සංචාරක ක්ෂේත්‍රය තුළ හදිසි නිපුණතා ඉල්ලුම සපුරාලීමට අවශ්‍ය හදිසි ඉගෙනුම් හා සංවර්ධන මැදිහත්වීම් සොයා බැලීම
- ❖ සංචාරක, සංචාර සහ ආගන්තුක සත්කාර කර්මාන්තය තුළ කටයුතු කරන ජනතාවට සංචාරකයින්ට ගුණාත්මක අත්දැකීමක් ලබාදීම සඳහා සුදුසු හැකියාවන් හා පුද්ගලික ආකල්ප ඇති බව සහ වර්තමානයට හා අනාගතයට අවශ්‍ය වන්නා වූ කර්මාන්තයේ දැනුම සහ හැකියාව ලබාදීම සඳහා අධ්‍යාපනය සහ පුහුණු ක්‍රමය නැවත සකස් කරනු ලබන බව සහතික කිරීම සඳහා මානව සම්පත් මැදිහත්වීම් නිර්දේශ කිරීම

ඉතා පුළුල්ව මෙම පත්‍රිකාවෙන් පහත සඳහන් දෑ සාකච්ජා කිරීමට උත්සාහ ගන්නා අතර පහත ස්ථර තුන ආවරණය කිරීම ක්‍රියාත්මක කිරීම සඳහා මැනියහැකි ක්‍රියාමාර්ග ලබා දේ.

- ❖ පුහුණු ශ්‍රමය ලබාදීම (කර්මාන්තයට අවශ්‍ය ප්‍රමාණයෙන් යෝග්‍ය දක්ෂ පුද්ගලයින් වෙත ප්‍රවේශය තිබීම)
- ❖ හැකියා ගොඩනැගීම (නිපුණතා, නායකත්වය සහ කළමනාකරණය වර්ධනය කිරීම තුළින් ඵලදායිතාව ඉහළ නැංවීම)
- ❖ ගුණාත්මක ගැටලු (ලබාදීමේ හා තක්සේරු කිරීමේ තත්ත්වය වර්ධනය කිරීම තුළින් නිපුණතා මට්ටම් වැඩිකිරීමට ක්‍රියාමාර්ග)

පහත සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් මනෝ සේකරම් මහතාගේ සභාපතිත්වය යටතේ වැඩ කණ්ඩායම් 01 හි ඉදිරිපත්කිරීම හා සොයාගැනීම් මෙම වාර්තාවෙන් සාරාංශ කරන ලදි.

**කාර්යය බලකාය: 01** **සභාපති : මනෝ සේකරම් මහතා සහ කමිටු සාමාජිකයින්**

| අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 1 | මනෝ සේකරම් මහතා | ප්‍ර.වි.නි. | 99x ටෙක්නොලොජි |
| 2 | ක්‍රිෂාන් සෙනෝ මහාතා | ප්‍ර.වි.නි. | ටෝපන් ෆෝර්මිස් |
| 3 | අමල් ගුණතිලක මහතා | උපදේශක | හොස්පිටලිටි මාකටින් |
| 4 | කාංචන නානායක්කාර මහතා | මානව සම්පත් ප්‍රධානී | ජෙට්වින්ග් |
| 5 | මාලිංග මහතා | කළමනාකාර අධ්‍යක්ෂ | හේමාස් ලෙෂර් |
| 6 | එස්.මුරලිදරන් මහතා | ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරි | සම්පත් IT සොලුෂන් |
| 7 | තිමති එඩ්වඩ් මහතා | MPSR | WUSC |
| 8 | සුජීව කුරේ මහතා | උප සභාපති/මානව සම්පත් | සිනමන් හෝටලය |
| 9 | පත්ම ලියනගේ මහතා | MSRP | හේලීස් |
| 10 | සුරේෂ් මුරුගේෂර් මහතා | උපදේශක | ඩිවියන්සි කන්සල්ටින් |
| 11 | ලලිතධීර මහතා | අධ්‍යක්ෂ | NHRDC |
| 12 | එස්. තනිගසීලන් මහතා | සහකාර අධ්‍යක්ෂ | NHRDC |
| 13 | ශ්‍රී ලාල් මිත්‍රපාල මහතා | උපදේශක | |
| 14 | ඉෂාරා නවුෆල් මහත්මිය | - | සිනමන් හෝටලය |
| 15 | ඉෂාන් දන්තනාරායන මහතා | ප්‍ර.වි.නි. | බ්‍රැන්ඩික්ස් |
| 16 | සන්ජීව් විජයසිංහ මහතා | මානව සම්පත් අධ්‍යක්ෂ | හේමාස් |
| 17 | දීප්ති ලනහේවා මහතා | DPD | WUSC |
| 18 | ඇන්ටන් ගොඩ්ෆ්‍රි මහතා | | |

**කාර්යය බලකාය: - 02**　　　**සභාපති : චන්ද්‍රා මොහොට්ටි මහතා සහ කමිටු සාමාජිකයින්**

| | නම | තනතුර | TPC |
|---|---|---|---|
| 1 | චන්ද්‍රා මොහොට්ටි මහතා | සභාපති –TVEC හි අංශ සභාව (සංචාරක) | සභාපති |
| 2 | මහාචාර්ය රජීව විජේසිංහ | සභාපති - TVEC | සාමාජික |
| 3 | ආචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙනිය | NHRDC කමිටු සාමාජික | සාමාජික |
| 4 | ආචාර්ය ලයනල් පින්තු | සභාපති – VTA | සාමාජික |
| 5 | බුද්ධික හේවාවසම් මහතා | DG –SLITHM | සාමාජික |
| 6 | ප්‍රබෝද් කුලතුංග මහතා | DDG –SLITHM | සාමාජික |
| 7 | රවීන්ද්‍ර මහගෙදර මහතා | විදුහල්පති - ගලකිස්ස හෝටලයේ ජාත්‍යන්තර හෝටල් පාසල | සාමාජික |
| 8 | ආර්.පණ්ඩිතකොරලගේ මහතා | අධ්‍යක්ෂ / ප්‍රධාන මා.ස.නි, එයිට්කන් ස්පේන්ස් | සාමාජික |
| 9 | මිලින්ද හෙට්ටිආරච්චි මහතා | ආගන්තුක සත්කාර පීඨය/ උසස් අධ්‍යාපනය පිළිබඳ ඇක්වයිනාස් කොලීජිය, හොටල් උපදේශක. බාහිර කතිකාචාර්ය හා කලාපීය අධ්‍යාපන උපදේශක/ ලූසන් විශ්ව විද්‍යාලය, ආගන්තුක කතිකාචාර්ය/ ව්‍යාපාර පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය | සාමාජික |
| 10 | සී. විදානපතිරණ මහතා | සහකාර අධ්‍යක්ෂ -VTA | සාමාජික |
| 11 | සුනිල් දිසානායක මහතා | සභාපති -SLITHM | සාමාජික |
| 12 | සරා සමන් මහත්මිය | SCG සමූහය, ග්ලෝබල් මොබිලිටි විශේෂඥ - හැකියා කළමනාකරණය | සාමාජික |
| 13 | කේ.ජේ.ලලිතධිර මහතා | අධ්‍යක්ෂ | NHRDC |
| 14 | එස්. තනිගසීලන් මහතා | සහකාර අධ්‍යක්ෂ | NHRDC |





## 5.5 ත්‍රීරෝද රියැදුරන් මෙම කර්මාන්තයට නැවත යෙදවීමේ CSC අනුමත උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ තීරණාත්මක වර්ධන කර්මාන්ත සඳහා දක්ෂයින් සැපයීම වැඩි කිරීමයි. EFC, SLTDA, ජාතික වාණිජ මණ්ඩලය, ත්‍රීරෝද සංගමය, සහ TVEC සමඟ සාකච්ඡා පවත්වන ලදී. TVEC විසින් පොලිස් පුහුණු පාසල, හෝටල් කර්මාන්තය, TVEC හි අංශ සභාව, NAITA සහ SLITHM සමඟ සහයෝගීත්වයෙන් "සංචාරක ටැක්සි රියැදුරු" පිළිබඳ NVQ මොඩියුලය සංවර්ධනය කර ඇත.

**කර්මාන්තය තුළට ත්‍රීරෝද රියැදුරන් සේවයේ යෙදවීමේ ක්‍රමෝපායන් හඳුනාගැනීම සඳහා සමීක්ෂණයක් පැවැත්වීම**

මෙම සමීක්ෂණයේ පරමාර්ථ:

- ත්‍රීරෝද රියැදුරන්ගේ සමාජ-ආර්ථික තත්ත්වයන් හඳුනාගැනීම
- නිපුණතා පුහුණු අවශ්‍යතාව සහ ඉදිරිගමන් මඟ හඳුනාගැනීම
- ප්‍රවාහන සේවා සඳහා විකල්ප සේවා හඳුනාගැනීම
- වර්ධනය වන අංශ වෙත ත්‍රීරෝද රියදුරන් සේවයේ යෙදවීමට ක්‍රමෝපායන් සංවර්ධනය

මෙම සමීක්ෂණය NHRDC කාර්ය මණ්ඩලයේ සහයෝගයෙන් කොළඹ, ගම්පහ, බදුල්ල, කුරුණෑගල, රත්නපුර සහ ගාල්ල යන දිස්ත්‍රික්ක හය තුළ පවත්වන ලදී. අවසන් වාර්තාව කෙටුම්පත් කළ අතර දත්ත ඉදිරිපත් කිරීම 2017 නොවැම්බර් අවසානයේදී සිදුකරන ලදී.





## 5.6 රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා විදේශ පුහුණු වැඩසටහන් - 2017

“අනාගතයට සූදානම් ශ්‍රමබලකායක්” යන දැක්ම යටතේ ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධන ජාතික සභාව රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා 2017 වසර තුළ වඩා සාර්ථක වැඩසටහන් සංවිධානය කිරීම අඛණ්ඩව සිදුකර ඇත. මෙවැනි වැඩසටහන්වල ප්‍රධාන පරමාර්ථය වූයේ රැකියාවන්ට අදාළ හැකියාවන් සහ රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ පුද්ගල වර්ධනය වැඩි කිරීමයි.

2017 දී, NHRDCට පොදුවේ රාජ්‍ය සේවයේ කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලය, පාසල් විදුහල්පතිවරුන්, විශ්වවිද්‍යාල පරිපාලන කාර්ය මණ්ඩලය සහ විශ්වවිද්‍යාල කාර්මික නිලධාරීන් වැනි විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා විදේශ පුහුණු වැඩසටහන් අටක් සංවිධානය කිරීමට හැකිවිය. මෙම වැඩසටහන් අට පහත පරිදි වේ.

### 5.6.1. කළමනාකාරිත්ව හැකියා සංවර්ධන වැඩසටහන (MCDP)

ඉහත මාතෘකාව යටතේ වැඩසටහන් තුනක් පවත්වන ලදි. වැඩසටහන්වල ඉලක්ක කණ්ඩායම වූයේ මධ්‍යම සහ ඉහල රාජ්‍ය අංශයේ කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලයි. එක් එක් වැඩසටහන සඳහා දේශීය සැසි දින 4ක් පවත්වන ලදි. රනිල් සුගතදාස මහතා, ආචාර්ය කුසුම් නන්දපාල සහ චමීර උඩවත්ත මහතා දේශීය සැසිවල සම්පත් දායකයින් වූහ. මෙම වැඩසටහන් තුනේ විස්තර පහත පරිදි වේ.

**MCDP III**

වැඩසටහනේ දේශීය සැසිය 2017 අප්‍රේල් 20 දින සිට 2017 අප්‍රේල් 23 දින දක්වා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී (SLIDA*)* පවත්වන ලද අතර විදේශීය සැසි 2017 අප්‍රේල් 30 දින සිට 2017 මැයි 06 දින දක්වා මැලේසියාවේ පුත්‍ර විශ්ව විශ්වවිද්‍යාලයේදී පවත්වනු ලැබීය. නිලධාරීහු 28 දෙනෙක් මේ සඳහා සහභාගි වූහ.

**MCDP IV**

වැඩසටහනේ දේශීය සැසිය 2017 අගෝස්තු 31, සැප්තැම්බර් 1, 7 සහ 8 යන දිනයන්හි දී මිලෝදා මූලා ඇකඩමියේදීද විදේශීය සැසිය 2017 සැප්තැම්බර් 17 දින සිට 23 දින දක්වා මැලේසියාවේ පුත්‍ර විශ්ව විශ්වවිද්‍යාලයේදී පවත්වනු ලැබීය. නිලධාරිහු 28 දෙනෙක් මේ සඳහා සහභාගි වූහ.

**MCDP V**

වැඩසටහනේ දේශීය සැසිය 2017 සැප්තැම්බර් 14, 15, 21 හා 22 යන දිනයන්හි දී මිලෝදා මූලා ඇකඩමියේදී ද පවත්වනු ලැබූ අතර විදේශීය සැසිය 2017 ඔක්තෝබර් 1 සිට 7 දක්වා පුත්‍රා විශ්වවිද්‍යාලයේදී ද පවත්වනු ලැබීය. නිලධාරීහු 20 දෙනෙක් මේ සඳහා සහභාගි වූහ.







### 5.6.2. පාසල් පදනම් කළමනාකරණය පිළිබඳ නායකත්ව වැඩසටහන් (SBM)

මෙම වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශයේ විශේෂ ඉල්ලීමක් යටතේ සංවිධානය කරන ලදි. එක් වැඩසටහනකට 30 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ඉහත මාතෘකාව යටතේ වැඩසටහන් දෙකක් පවත්වා ඇත. මෙම වැඩසටහනේ ඉලක්කය වූයේ පාසල් විදුහල්පතිවරුන්ය. SBM පිළිබඳ නායකත්ව වැඩසටහන් දෙකේ විස්තර පහත දැක්වේ.

SBM පිළිබඳ නායකත්ව වැඩසටහන I – 2017 නොවැම්බර් 8 සිට 15 දක්වා පවත්වන ලදි.

SBM පිළිබඳ නායකත්ව වැඩසටහන II – 2017 නොවැම්බර් 15 සිට 22 දක්වා පවත්වන ලදි.

### 5.6.3. තාක්ෂණික නිලධාරීන් දක්ෂතා හැකියා සංවර්ධන වැඩසටහන (CDP)

මෙම මාතෘකාව යටතේ වැඩසටහන් දෙකක් පවත්වන ලදි. මෙම වැඩසටහනේ ඉලක්ක කණ්ඩායම වූයේ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල කාර්මික නිලධාරීන්ය. වැඩසටහන් දෙකේ විස්තර පහත දැක්වේ.

CDP I - විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩල කාර්මික නිලධාරීන් සඳහා -

මෙම වැඩසටහන සඳහා නිලධාරීහු 26 දෙනෙක් සහභාගිවූහ. මෙම වැඩසටහන පැවැත්වූයේ 2017 ජූලි 9 දින සිට ජූලි 15 දින දක්වා කාලය තුළදීය.

CDP II - විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩල කාර්මික නිලධාරීන්ය සඳහා -

මෙම වැඩසටහන සඳහා සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව 28 කි. 2017 ඔක්තෝබර් 22 දින සිට ඔක්තෝබර් 28 දින දක්වා කාලය තුළ අදාළ වැඩසටහන පැවැත්විණි.





### 5.6.4. කළමනාකාරිත්ව සහ පරිපාලන දක්ෂතා සංවර්ධන වැඩසටහන

මෙම වැඩසටහන 2017 පෙබරවාරි 12 දින සිට පෙබරවාරි 18 දින දක්වා පවත්වන ලදි. මෙම වැඩසටහනේ ඉලක්ක කණ්ඩායම වූයේ විශ්ව විද්‍යාල පරිපාලන කාර්යය මණ්ඩලයි. විවිධ ආයතනවලින් නිලධාරීහු විසි හතර දෙනෙක් මෙම වැඩසටහන සඳහා සහභාගි වූහ.



## 5.7 ඵලදායි සහ සදාචාර රාජ්‍ය සේවා සංස්කෘතියක් සඳහා පොදු නිපුණතා රාමුව

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව (NHRDC) රාජ්‍ය අංශය තුළ නිලධාරීන්ගේ නිපුණතා හා දක්ෂතා ඉහළ දැමීම සඳහා අධ්‍යයනයක් සිදුකරන ලදි. ප්‍රවීණයින්ගේ කණ්ඩයමක් සමඟ NHRDC විසින් සිදුකළ අධ්‍යයනය මත පදනම් වී, රාජ්‍ය අංශය සඳහා පොදු නිපුණතා රාමුවක් සංවර්ධනය කරනු ලැබිය. පොදු නිපුණතා රාමුව 2017 ජූනි 22 දින පැවති රැස්වීමේදී කැබිනට් අනුකමිටුව මගින් අනුමතකර ඇත. පහත සඳහන් සාමාජිකයින් පොදු නිපුණතා රාමුව ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සංවර්ධනය කිරීම සඳහා පත් කෙරිණි.

| කමිටු සාමාජිකයාගේ නම | ආයතනය | තනතුර |
|---|---|---|
| මහාචාර්ය ගාමිණී අල්විස් | | හිටපු ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය |
| ආර්.ඒ. කෝලිත රණවක මහතා | NIBM | ප්‍රධානී (කළමනාකරණ සංවර්ධන) |
| ඒ.බී.එම්. අෂ්රෆ් මහතා | SLIDA | ජ්‍යෙෂ්ඨ උපදේශක |
| සමන්ත රත්නායක මහතා | PIM | කළමනාකරණ උපදේශක |

ඊළඟ පියවර ලෙස, මානව සම්පත් සංවර්ධන ක්ෂේත්‍රය තුළ ප්‍රවීණයින්ගේ අදහස් හා යෝජනා සමඟ ඉහත නිපුණතා රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග සැලැස්මක් සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

## 5.8 NHRDC දේශන මාලාව

කළමනාකාරිත්ව මට්ටම් සහ ඊට පහළ මට්ටම්වල රාජ්‍ය සේවකයින්ගේ නිපුණතා සංවර්ධනය කරලීම පිණිස පහත සඳහන් මාතෘකා සම්බන්ධයෙන් දේශන මාලා අප සභාව මගින් පවත්වා ඇත. විවිධ අංශ නියෝජනය කරමින් සහභාගිවූ රාජ්‍ය අංශ සේවකයෝ අදාළ දේශන මාලා සම්බන්ධයෙන් ධනාත්මකව ප්‍රතිචාර දැක්වූහ. විවිධ අංශ ආවරණය කිරීම සඳහා රජයේ නිලධාරීන් විසින් විශේෂ දේශක මඬුල්ලක් මගින් දේශන මාලාවක් පැවැත්වීමට නියමිතය.

**2017 වසර තුළ පවත්වන ලද දේශන පිළිබඳ සාරාංශය**

| මාතෘකාව | සම්පත් දායකයාගේ නම | දිනය | සංඛ්‍යාව |
|---|---|---|---|
| පාරිභෝගික සත්කාරය | ධම්මික කල්පගේ මහතා | 2017.01.10 | 185 |
| මානව විශ්වාසය | ආචාර්ය රුවන්ති ද සිල්වා | 2017.03.07 | 110 |
| ඉහළම මානව සම්පත් ප්‍රවණතා | ක්‍රිෂාන්ති කුරේ මහත්මිය | 2017.05.04 | 107 |
| රාජ්‍ය අංශයේ ගිණුම්කරණ කුසලතා වැඩි කිරීම | ජේ.එම්.යූ.බී.ජයසේකර මයා | 2017.06.22 | 122 |
| යහපාලනය සහ රාජ්‍ය සේවයේ කාර්යභාරය | ආචාර්ය ලොයිඩ් ප්‍රනාන්දු සහ සමන්ත රත්නායක මහතා | 2017.10.04 | 120 |
| සයිබර් ආරක්ෂණ සාකච්ඡාව | බොෂාන් දයාරත්න මහතා | 2017.11.28 | 137 |
| රාජ්‍ය අංශයට ඵලදායි වැඩ ක්‍රම හඳුන්වාදීම | අරෝෂා ජයසුන්දර මහත්මිය | 2017.12.14 | 55 |

පාරිභෝගික සත්කාරය



මානව විශ්වාසය (***Human Confidence***)




ඉහළම මානව සම්පත් ප්‍රවණතා(***Top HR Trends***)




ගිණුම්කරණ කුසලතා වැඩි කිරීම



යහපාලනය සහ රාජ්‍ය සේවයේ කාර්යභාරය



සයිබර් ආරක්ෂක සාකච්ඡාව



## 5.9 සංඛ්‍යාන අත්පොත

අපගේ දැක්ම පරිදි කළමනාකාරිත්වය විසින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අංශය සම්බන්ධව අදාළ පාර්ශවකරුවන් පිළිබඳ තොරතුරු පරතරය අවම කිරීම සඳහා වාර්ෂිකව සංඛ්‍යාලේඛන අත්පොතක් ප්‍රකාශයට පත් කිරීමට තීරණය කර ඇත. මේ සම්බන්ධයෙන් නව අත්පොත 2017 වසර තුළ ප්‍රකාශයට පත් කර ඇත.

මෙම අත්පොත තුළ, සාමාන්‍ය අධ්‍යාපනය, තෘතීයික, නිපුණතා හා වෘත්තීය අධ්‍යාපනය සහ උසස් අධ්‍යාපන අංශ හා අදාළ වැදගත් සංඛ්‍යා ලේඛන ඇතුළත් කර ඇත. සියලුම දත්ත වෙබ් අඩවිය, ශ්‍රී ලංකාවේ 2016 මහ බැංකු වාර්ෂික වාර්තාව, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විශ්ව විද්‍යාල සංඛ්‍යා ලේඛන වැනි මාධ්‍ය වලින් ලබාගත හැකි ද්විතීය දත්ත මූලාශ්‍ර මත පදනම්වී රැස්කරනු ලැබිය. මෙම අත්පොතේ දත්ත ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අංශය පිළිබඳ උනන්දුවක් ඇති පර්යේෂකයින්ට, ප්‍රතිපත්ති සම්පාදකයින්ට වැදගත් වනු ඇත.

## 5.10 අධ්‍යක්ෂවරුන්ගේ අත්පොත

ගරු කථානායකතුමාගේ මඟපෙන්වීම මත, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහයෝගය ඇතිව මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව විසින් පවත්නා මාර්ගෝපදේශයන් යාවත්කාලීන කරමින් රාජ්‍ය ව්‍යවසායන්හි සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා යහපාලනය මැයෙන් අත්පොතක් සකස් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය අවශ්‍ය කරන විශිෂ්ඨතම ප්‍රායෝගික ක්ෂේත්‍ර පිළිබඳව මාර්ගෝපදේශනය සහ පැහැදිලි කිරීම මෙම අත්පොත මඟින් සපයයි. රාජ්‍ය ව්‍යවසායන්හි සභාපතිවරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩල වෙත යොමු කරන ලද යහපාලනය පිළිබඳ මෙම අත්පොත එම ආයතනවල කටයුතු ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට මගපෙන්වීමක් වනු ඇත. එය ප්‍රධාන වශයෙන් වාණිජ රාජ්‍ය ව්‍යාපාරවලට අදාළ වේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශ ඒකකයේ සභාපති, හිටපු රාජ්‍ය ව්‍යවසාය අධ්‍යක්ෂ ජනරාල් සහ මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ මූල්‍ය කළමනාකරණ උපදේශක කනගසබාපති මහතා විසින් සභාපතිධූරය දරනු ලදුව ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව යන ආයතනවල නියෝජිතයින්ගෙන් සමන්විත කමිටුවක් විසින් මෙම කාර්යය සිදුකරන ලදි. මෙම අත්පොතේ මුල් පිටපත 2017 දෙසැම්බර් මස 5 වැනි දින පැවති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ වාර්ෂික සම්මාන ප්‍රදානෝත්සවයේදී ගරු අග්‍රාමාත්‍යවරයා වෙත භාරදෙන ලදි.

## 5.11 “රාජ්‍ය අංශයේ සේවය කිරීමේ නව මාර්ග” මැයෙන් වූ වාර්තාව

රාජ්‍ය අංශයේ සේවය කිරීමේ මාර්ග වැඩිදියුණු කිරීම පිළිබඳ වාර්තාවක් ජාතික මානව සම්පත් සංවර්ධන සභාව විසින් සකස් කර ඇත. මෙය අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අග්‍රාමාත්‍යතුමා වෙත යොමු කර ඇති අතර, කාර්යයන් ඉදිරියට සිදුකිරීම සඳහා ප්‍රතිචාර අපේක්ෂාවෙන් සිටී.

ජාතික මානව සම්පත් සංවර්ධන සභාව විසින් පත්කරන ලද කමිටුවක් විසින් මෙම වාර්තාව සකස් කරන ලද අතර, එම කමිටුව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, කම්කරු අමාත්‍යාංශය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, ලංකා වාණිජ මණ්ඩලය, ජෙට්වින්ග් සමූහය ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව යන ආයතනවල නියෝජිතයින්ගෙන් සමන්විත විය. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ හිටපු සභාපති සහ හිටපු උසස් අධ්‍යාපන ඇමති මහාචාර්ය රජීව් විජේසිංහ මහතා එහි සභාපතිත්වය දරණ ලදි.

ධර්මසිරි පීරිස්, එච්.එම්.ජී. එස්. පලිහක්කාර, මහින්ද මඩිහහේවා සහ මාලිනී පීරිස් යන මහත්ම මහත්මීන් ඇතුළු රාජ්‍ය සේවයේ කීර්තිමත් විශ්‍රාමික සාමාජිකයන්ගේ ලිඛිත අදහස්වලින් කමිටුවට ප්‍රයෝජන ලැබුනු අතර, මූලික වෙනස්කම් සඳහා වන අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු විය. රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය මෙන්ම ප්‍රතිපත්ති හා භාවිතයන් සම්බන්ධව අඛණ්ඩභාවය, ඵලදායීතාවය ඉහළ නැංවීම, විශේෂයෙන් කිසියම් පත්වීම් ලබා දීම් සම්බන්ධයෙන් තාර්කිකයන් නියමකිරීම සහ එකඟතාවයට පැමිණි ඉලක්ක සඳහාවන අභ්‍යන්තරික විශ්වාසය ද ඇතුළත්ව වගවීම් යාන්ත්‍රණ සඳහා ආරක්ෂාව සපයා ගැනීම, වාර්තාව මඟින් ආමන්ත්‍රණය කරන ලද ක්ෂේත්‍ර අතරට ගැනේ.

## 5.12 විගණන කමිටුවල යහපාලනය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ ජාතික මානව සම්පත් සංවර්ධන සභාව ප්‍රයත්නයක -

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ ජාතික මානව සම්පත් සංවර්ධන සභාව සමඟ එක්ව රාජ්‍ය ව්‍යවසායන්හි විගණන කමිටු නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් 180 වඩා වැඩි දෙනෙකුගේ සහභාගිත්වය ඇතිව “විගණන කමිටුවල කාර්යභාරය” මැයෙන් වැඩමුළුවක් පවත්වන ලදි. ගරු අගමැතිවරයාගේ මෙහෙයවීම යටතේ යහපාලනය නංවාලීම සඳහා වූ රජයේ ඉලක්කයට සහාය දැක්වීම සහ රාජ්‍ය ව්‍යවසායන්හි අධ්‍යක්ෂවරුන් සඳහා ඒකීය කුසලතා සමූහයන් නිර්මාණය කිරීම මෙම වැඩපිළිවෙළ හරහා ක්‍රියාත්මක වේ.

මෙම වැඩමුළුව සඳහා සහභාගි වූ සම්පත් දායකයින් අතර ජාතික මානව සම්පත් සංවර්ධන සභාවේ සභාපති දිනේෂ් වීරක්කොඩි, සහකාර විගණකාධිපති ඊ.ඒ.ජී. ආනන්ද, අර්නස්ට් ඇන්ඩ් යංහි හවුල්කරු

මනිල් ජයසිංහ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ රාජ්‍ය අංශ ඒකකයේ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ සභාපති සහ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පිළිබඳ කමිටුවේ සභාපති වී. කනගසබාපති, KPMG හි කළමනාකරණ හවුල්කරු රියාස් මිහුලාර් සහ යන BDO පාට්නර්ස්හි හවුල්කරු තිෂාන් සුබසිංහ යන මහත්වරු වූහ. වැඩමුළුව අතරතුර, විගණන කමිටුවල යහපත උදෙසාවන යහපාලනය පිළිබඳ මගපෙන්වීම හා පැහැදිලිකිරීම සම්පත් දායකයින් විසින් සිදුකරන ලදි.

## 5.13 NHRDC විසින් ISO 9001:2015 සහතිකයට අනුකූලවීම

"අනාගතයට සූදානම් ශ්‍රමබලකායක්" යන දැක්ම සහිතව මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව විසින් මෙරට මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් වෙනුවෙන් ISO 9001: 2015 අන්තර් ජාතික ප්‍රමිතියට අනුකූලවීමේ අවශ්‍යතා සමඟ අනුකූල වන ආයතනයක් ලෙස හඳුනාගනු ලැබීය.

2017 පෙබරවාරි 7 දින ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිලධාරීන් විසින් පවත්වන ලද විගණනය මත පදනම් වී, මෙම ආයතනය ISO 9001:2015 තත්ත්ව කළමනාකරණ ක්‍රමය සමඟ අනුකූලවන බවට නැවතත් අපිව නිර්දේශ කරන ලදි. නව තත්ත්ව ප්‍රතිපත්තියට අනුව, ආයතනයට අවශ්‍ය කරන සියලුම ලේඛන ආයතනය විසින් සකස් කර ඇති බවට විගණන කණ්ඩායම නිර්දේශ කරන ලදි. 2017 දී, තත්ත්ව අත්පොත, ක්‍රියාපටිපාටි අත්පොත සහ අභ්‍යන්තර විගණන සැලැස්ම තුළ යම් වෙනස්වීම් සිදුකරන ලදි. අපගේ නිලධාරීන් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් අභ්‍යන්තර විගණන පුහුණු වැඩසටහන් මගින් පුහුණුව ලබා දී ඇත.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් හඳුන්වා දෙන ලද ISO 9001: 2015 තත්ත්ව කළමනාකරණ ක්‍රමය සමඟ අනුකූල වෙමින් ගුණාත්මක සේවාවක් ලබාදීමට අපි බැඳී සිටිමු.

## 6. 2017 වසර තුළදී මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවේ සිදුකරන ලද පර්යේෂණ වාර්තා හා ප්‍රකාශන




සංඛ්‍යාන අත්පොත- **2017**




කාන්තා ශ්‍රමබලකා සහභාගිත්වය




අධ්‍යක්ෂවරුන් සඳහා අත්පොත

## 7. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
**2017 දෙසැම්බර් 31 දිනට**

| | සටහන | 2017 | 2016 | ශ්‍රීලංරු<br>අයවැයගත මුදල |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| මුදල් හා මුදලට සමාන දෑ | 1 | 8,565,644.90 | 9,877,733.94 | 8,757,030.58 |
| ලැබීම් | 2 | 71,162.82 | 71,162.82 | 71,162.82 |
| භාණ්ඩ තොග | 3 | 619,970.85 | 564,975.70 | 562,000.00 |
| පෙර ගෙවීම් | 4 | 164,415.91 | - | 170,000.00 |
| අනෙකුත් ජංගම වත්කම් | 5 | 2,836,874.76 | 2,668,029.66 | 2,810,000.00 |
| | | **12,258,069.24** | **13,181,902.12** | **12,370,193.40** |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| යටිතල පහසුකම්, පිරියත හා උපකරණ | 6 | 14,805,195.29 | 5,633,698.01 | 13,000,000.00 |
| මෝටර් රථ | 6 | 9,326,611.88 | 13,183,305.94 | 11,864,975.35 |
| අනෙකුත් වත්කම් | 6 | 582,804.46 | 779,918.91 | 900,000.00 |
| | | 24,714,611.63 | 19,596,922.86 | 25,764,975.35 |
| **මුළු වත්කම්** | | **36,972,680.87** | **32,778,824.98** | **38,135,168.75** |
| **වගකීම්** | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| ගෙවීමට ඇති | 7 | 1,192,086.32 | 846,668.75 | 254,046.47 |
| කෙටි කාලීන වෙන්කිරීම් | 8 | 313,742.82 | 313,742.82 | 313,742.82 |
| | | **1,505,829.14** | **1,160,411.57** | **567,789.29** |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| සේවක ප්‍රතිලාභ | 9 | 1,990,089.75 | 1,509,772.75 | 1,900,000.00 |
| | | **1,990,089.75** | **1,509,772.75** | **1,900,000.00** |
| **මුළු වගකීම්** | | **3,495,918.89** | **2,670,184.32** | **2,467,789.29** |
| **ශුද්ධ වත්කම්** | | **33,476,761.98** | **30,108,640.66** | **35,667,379.46** |

**ශුද්ධ වත්කම්/ස්කන්ධය**

**<u>දායක කළ ප්‍රාග්ධනය</u>**

| | | | |
|---|---|---|---|
| දායක ප්‍රාග්ධනය | 3,000,000.00 | 3,000,000.00 | 3,000,000.00 |
| ප්‍රත්‍යාගණන සංචිත | 13,490,249.80 | 13,490,249.8 | 6,000,000.00 |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය | 14,636,523.89 | 15,435,982.49 | 15,500,000.00 |
| සමුච්චිත අතිරික්තය/(හිඟය) | 2,349,988.29 | (1,817,591.63) | 2,000,000.00 |
| **මුළු ශුද්ධ වත්කම් /ස්කන්ධය** | 33,476,761.98 | 30,108,640.66 | 26,500,000.00 |

සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) සභාපති

දිනය: දිනය:

## 8.මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

### 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2017 | 2016 | ශ්‍රීලංරු<br>අයවැයගත මුදල |
|---|---|---|---|---|
| **ආදායම** | | | | |
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | 10 | 21,133,114.00 | 21,500,000.00 | 22,823,801.00 |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය | 11 | 12,623,137.60 | 11,389,837.06 | 15,650,000.00 |
| වෙනත් ප්‍රදාන | 12 | 6,861,867.08 | 1,073,187.14 | 6,000,000.00 |
| වත්කම් බැහැරකිරීමෙන් ලාභ | 13 | (1,068,524.32) | (5,662.59) | (1,000,000.00) |
| අනෙක් ආදායම | 14 | 140,792.29 | 185,137.58 | 160,000.00 |
| **මුළු ආදායම** | | **39,690,386.65** | **34,142,499.19** | **43,633,801.00** |
| **වියදම්** | | | | |
| පඩිනඩි, වැටුප් හා සේවක ප්‍රතිලාභ | 15 | 17,443,075.49 | 15,706,158.54 | 17,279,130.00 |
| ප්‍රදාන හා අනෙක් මාරුකළ ගෙවීම් | 16 | 6,727,619.63 | 6,663,006.94 | 8,385,000.00 |
| සැපයුම් හා භාවිත කළ පරිභෝජන භාණ්ඩ | 17 | 680,040.50 | 789,950.36 | 900,000.00 |
| ක්ෂය කිරීමේ හා ක්‍රමක්ෂය වියදම | 6 | 5,689,845.88 | 5,076,989.77 | 5,700,000.00 |
| ගමන් වියදම්, යැපීම් හා දීමනා | 18 | 336,527.50 | 189,902.50 | 347,600.00 |
| උපයෝගිතා සහ සේවා | 19 | 2,993,768.87 | 3,196,272.23 | 3,124,280.00 |
| නඩත්තු වියදම් | 20 | 1,459,557.36 | 1,396,272.13 | 1,240,000.00 |
| අනෙකුත් වියදම් | 21 | 192,371.50 | 208,988.00 | 193,500.00 |
| **මුලු වියදම්** | | **35,522,806.73** | **33,197,495.47** | **37,169,510.00** |
| **කාලච්ඡේදය සඳහා අතිරික්තය /(හිගය)** | | **4,167,579.92** | **945,003.72** | **6,464,291.00** |

## 9.ශුද්ධ වත්කම්/ස්කන්ධය තුළ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

ශ්‍රීලංරු.වලින්

| පාලන ආයතනයේ හිමිකරුවන්ට බෙදීයාම | | | | | |
|---|---|---|---|---|---|
| | **දායක ප්‍රාග්ධනය** | **ප්‍රත්‍යාගණන සංචිත** | **රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය** | **සමුච්චිත අතිරික්තය/ (හිඟය)** | **මුළු ශුද්ධ වත්කම/ස්කන්ධය** |
| 2016 ජනවාරි 01 දිනට ප/ගේ ශේෂය | 3,000,000.00 | 2,063,777.2 | 13,148,819.55 | (2,762,595.35) | 15,450,001.40 |
| බැහැර කළ වත්කම් මත ප්‍රත්‍යාගණන අතිරික්තය | - | 11,426,472.60 | - | - | 11,426,472.60 |
| රජයේ ප්‍රදාන - ආදායම වෙත මාරු කිරීම | - | - | (6,656,903.22) | - | (6,656,903.22) |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ වත්කම්/ ස්කන්ධය/හිඟය/ අතිරික්තය තුළ සෘජුවම හඳුනාගත් ශුද්ධ ආදායම | - | - | 13,677,000.00 | - | 13,677,000.00 |
| ප්‍රත්‍යාගණනය කළ වත්කම් මත පෙර ප්‍රත්‍යාගණන අතිරික්තය හඳුනා නොගැනීම | - | - | - | - | - |
| විලම්භිත ආදායම | - | - | (4,732,933.84) | - | (4,732,933.84) |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ හිගය | - | - | - | 945,003.72 | 945,003.72 |
| කාලපරිච්ඡේදය සඳහා මුළු හඳුනාගත් ආදායම සහ වියදම් | - | 11,426,472.60 | 2,287,162.94 | 945,003.72 | 14,658,639.26 |
| **2016 දෙසැම්බර් 31 දිනට ඉ/ගේ ශේෂය** | **3,000,000.00** | **13,490,249.80** | **15,435,982.49** | **(1,817,591.63)** | **30,108,640.66** |
| 2017 ජනවාරි 01 දිනට ප/ගේ ශේෂය | | | | | |
| පෙර වසරේ ගැලපීම | 3,000,000.00 | 13,490,249.80 | 15,435,982.49 | (1,817,591.63) | 30,108,640.66 |
| බැහැරකළ වත්කම් මත ප්‍රත්‍යාගණන අතිරික්තය | - | - | - | - | - |
| රජයේ ප්‍රදාන - ආදායම වෙත මාරු කිරීම | - | - | - | - | - |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ වත්කම්/ ස්කන්ධය/හිඟය/ අතිරික්තය තුළ සෘජුවම හඳුනාගත් ශුද්ධ ආදායම | - | - | 11,823,679.00 | - | 11,823,679.00 |
| විලම්භිත ආදායම | - | - | (5,689,845.88) | - | (5,689,845.88) |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ හිඟය | - | - | - | 4,167,579.92 | 4,167,579.92 |
| කාලපරිච්ඡේදය සඳහා මුළු හඳුනාගත් ආදායම සහ වියදම් | - | - | (799,458.60) | 4,167,579.92 | 3,368,121.32 |
| **2017 දෙසැම්බර් 31 දිනට ඉ/ගේ ශේෂය** | 3,000,000.00 | 13,490,249.80 | 14,636,523.89 | 2,349,988.29 | 33,476,761.98 |

## 10.මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2017 | 2016 |
|---|---|---|
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ** | | |
| අතිරික්තය/ (හිඟය) | 4,167,579.92 | 945,003.72 |
| <u>මුදල් නොවන චලනයන්</u> | | |
| ක්ෂයකිරීම | 5,689,845.88 | 5,076,989.77 |
| පාරිතෝෂිත වියදම් | 480,317.00 | 82,684.87 |
| පෙර වසරේ ගැලපීම | - | - |
| විලම්භිත ආදායම | (5,689,845.88) | (4,732,933.84) |
| වෙන්කිරීමට වැඩි විගණන ගාස්තුව | (6,325.00) | (4,481.00) |
| සේවක ණය මත පොළී | (108,396.55) | (93,554.45) |
| විගණන ගාස්තුව | 80,500.00 | 80,500.00 |
| දේපළ, පිරියත හා උපකරණ අළෙවිය මත (ලාභ)/අලාභ | 1,068,524.32 | 5,662.59 |
| පරිභෝජන ගබඩාව තුළ වැඩිවීම් (අඩුවීම්) | (54,995.15) | (2,781.07) |
| පෙර ගෙවුම්වල වැඩිවීම් (අඩුවීම්) | (164,415.91) | 179,949.64 |
| සේවක ණයවල වැඩිවීම් (අඩුවීම්) | (418,700.60) | (272,566.68) |
| අනෙකුත් අත්තිකාරම්වල වැඩිවීම් (අඩුවීම්) | (15,000.00) | 1,250.00 |
| ගෙවීමට ඇති දෑ හි වැඩිවීම් (අඩුවීම්) | 345,417.57 | 529,967.68 |
| අනෙකුත් ජංගම වත්කම්වල වැඩිවීම් (අඩුවීම්) | 264,855.50 | (264,855.50) |
| ලැබීම්වල වැඩිවීම් (අඩුවීම්) | - | - |
| ගෙවූ විගණන ගාස්තුව | (74,175.00) | (80,519.00) |
| ගෙවන ලද පාරිතෝෂික | - | (433,818.00) |
| රජයේ ප්‍රදාන | 4,890,387.28 | 7,020,096.78 |
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහ** | **10,455,573.38** | **8,036,595.20** |

**ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ**

| | | |
|---|---|---|
| ගොඩනැගිලි හා ව්‍යුහ මිලදී ගැනීම | (6,531,265.68) | - |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් මිලදී ගැනීම | (4,235,272.50) | (164,169.00) |
| කාර්යාල උපකරණ මිලදී ගැනීම | (496,274.65) | (74,750.00) |
| විදුලිමය සවිකිරීම් මිලදී ගැනීම | - | - |
| පරිගණක මිලදී ගැනීම | (527,420.00) | (326,600.00) |
| මෝටර්රථ මිලදී ගැනීම | - | - |
| සේවක ණය මත පොළිය | 108,396.55 | 93,554.45 |
| මෘදුකාංග මිලදී ගැනීම | - | - |
| පොත් මිලදී ගැනීම | (29,414.84) | (11,883.00) |
| වෙනත් වත්කම් මිලදී ගැනීම | (56,411.30) | - |
| පිරියත හා උපකරණ විකිණීමෙන් ලත් මුදල් | - | 1,000.00 |
| **ආයෝජන කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(11,767,662.42)** | **(482,847.55)** |

**මූල්‍ය කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ**

| | | |
|---|---|---|
| මූල්‍ය කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහ | - | - |
| මුදල් හා මුදලට සමාන දෑ තුළ ශුද්ධ වැඩිවීම් (අඩුවීම්) | (1,312,089.04) | 7,553,747.65 |
| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දෑ | 9,877,733.94 | 2,323,986.29 |
| කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ | **8,565,644.90** | **9,877,733.94** |

**මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සටහන්**

අතැති මුදල් සහ බැංකු සමග ශේෂ

| | | |
|---|---|---|
| මහජන බැංකු ගිණුම් අංකය 119100120409161 | 8,375,225.10 | 487,712.25 |
| ලංකා බැංකු ගිණුම 165197 | 190,419.80 | 9,390,021.69 |
| | **8,565,644.90** | **9,877,733.94** |

## 11.සටහන්

| | | 2017 | 2016 | අයවැයගත මුදල් |
|---|---|---|---|---|
| <u>මුදල් හා මුදලට සමාන දෑ</u> | 1 | | | |
| මහජන බැංකු ගිණුම් අංකය No 119100120409161 | | 8,375,225.10 | 487,712.25 | 8,000,000.00 |
| ලංකා බැංකු ගිණුම 165197 | | 190,419.80 | 9,390,021.69 | 757,030.58 |
| | | **8,565,644.90** | **9,877,733.94** | **8,757,030.58** |
| <u>ලැබීම්</u> | 2 | | | |
| නිමල් බෝපගේ (හිටපු සභාපති) | | 71,162.82 | 71,162.82 | - 71,162.82 |
| | | **71,162.82** | **71,162.82** | **71,162.82** |
| <u>භාණ්ඩ තොග</u> | 3 | | | |
| පරිභෝජන භාණ්ඩ ගබඩා | | 619,970.85 | 564,975.70 | 562,000.00 |
| | | **619,970.85** | **564,975.70** | **562,000.00** |
| <u>පෙර ගෙවීම්</u> | 4 | | | |
| රථවාහන රක්ෂණය | | 164,415.91 | - | 170,000.00 |
| | | **164,415.91** | - | **170,000.00** |
| <u>වෙනත් ජංගම වත්කම්</u> | 5 | | | |
| සේවක ණය - ආපදා | | 2,811,874.76 | 2,393,174.16 | 2,800,000.00 |
| උත්සව අත්තිකාරම් | | 10,000.00 | 10,000.00 | 10,000.00 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | | 15,000.00 | - | - |
| WIP ඉදිකිරීම | | - | 264,855.50 | - |
| | | **2,836,874.76** | **2,668,029.66** | **2,810,000.00** |

# දේපළ, පිරියත හා උපකරණ (සටහන 06)

| | ගෘහභාණ්ඩ හා සවිකිරීම් | | කාර්යාල උපකරණ | | විදුලිමය සවිකිරීම් | | පරිගණක | | මෘදුකාංග | | වාහන | | පොත් | | වෙනත් වත්කම් | | ගොඩනැගිලි හා ව්‍යුහ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වාර්තා කරන කාලය 2017.01.01 සිට 2017.12.31 දක්වා | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 |
| ආරම්භක ශේෂය | 2,239,912.21 | 2,075,743.21 | 2,935,476.29 | 2,873,646.29 | 66,135.25 | 66,135.25 | 5,190,792.98 | 4,865,592.98 | 776,556.61 | 776,556.61 | 14,200,000.00 | 18,750,000.00 | 98,245,15 | 86,362.15 | 1,278,824.50 | 1,278,824.50 | - | - |
| එකතුකිරීම් | 4,235.272.50 | 164,169.00 | 496,274.65 | 74,750.00 | - | - | 527,420.00 | 326,600.00 | - | - | - | 14,200,000.00 | 29,414,84 | 11,883.00 | 56,411.30 | - | 6,531,265.68 | - |
| ගැලපීම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| බැහැරකිරීම් | (1,510,495.62) | - | (53,707.95) | (12,920.00) | - | - | - | (1,400.00) | - | - | - | (18,750,000.00) | - | - | (257,730.00) | - | - | - |
| අවසාන ශේෂය | 4,964,689.09 | 2,239,912.21 | 3,378,042.99 | 2,935,476.29 | 66,135.25 | 66,135.25 | 5,718,212.98 | 5,190,792.98 | 776,556.61 | 776,556.61 | 14,200,000.00 | 14,200,000.00 | 127,659.99 | 98,245.15 | 1,077,505.80 | 1,278,824.50 | 6,531,265.68 | - |
| සමුච්චිත ක්ෂයකිරීම(වසර ආරම්භයේදී) | 1,044, 791.00 | 833,625.95 | 1,198,822.90 | 921,331.07 | 30,326.33 | 26,061.90 | 2,707,675.64 | 1,877,434.40 | 593,559.46 | 399,420.31 | 1,016,694.06 | 13,552,671.23 | 77,635.08 | 75,299.01 | 519,515.66 | 410,316.50 | - | - |
| ගැලපීම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ක්ෂයකිරීම (මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය පරිදි) | 334,120.11 | 211,165.05 | 293,842.29 | 284,672.16 | 2,915.80 | 4,264.43 | 894,837.95 | 830,718.32 | 182,280.03 | 194,139.15 | 3,856,694.06 | 3,440,495.43 | 3,676.74 | 2,336.07 | 117,900.12 | 109,199.16 | 3,578.78 | - |
| අඩුකළා බැහැරකිරීම මත සමුච්චිත ක්ෂයකිරීම | (626,506.18) | - | (30,536.80) | (7,180,33) | - | - | - | (477.08) | - | - | - | - | - | - | (96,366.27) | - | - | - |
| ප්‍රත්‍යාගණන වත්කම් මත සමුච්චිත ක්ෂය කිරීම | - | - | - | - | - | - | - | 2,707,675.64 | - | - | - | (15,976,472.60) | - | - | - | - | - | - |
| අවසාන ශේෂය | 752,404.93 | 1,044,791.00 | 1,462,128.39 | 1,198,822.90 | 33,242.12 | 30,326.33 | 3,602,513.59 | 2,707,675.64 | 775,839.49 | 593,559.46 | 4,873,388.12 | 1,016,694.06 | 81,311,82 | 77,635.08 | 541,049.51 | 519,515.66 | 3,578.78 | - |
| ශුද්ධ ධාරණ අගය | 4,212,284.16 | 1,195,121.21 | 1,915,914.60 | 1,736,653.39 | 32,893.12 | 35,808.92 | 2,115,699.39 | 2,483,117.34 | 717.12 | 182,997.15 | 9,326,611.88 | 13,183,305.94 | 46,346.17 | 20,610.07 | 536,456.29 | 759,308.84 | 6,527,686.90 | - |

| | සටහන | **2017** | | **2016** | | අයවැයගත මුදල |
|---|---|---|---|---|---|---|
| **ගෙවියයුතු** | **7** | | | | | |
| දුරකථන බිල් | | 46,851.25 | | 21,331.31 | | 21,000.00 |
| අන්තර්ජාල පහසුකම් | | 27,380.00 | | 13,690.00 | | 13,690.00 |
| පුවත්පත් බිල් | | 1,990.00 | | - | | 3,000.00 |
| සනීපාරක්ෂක හා ආරක්ෂණ | | 125,356.47 | | 125,356.47 | | 125,356.47 |
| දේශීය ගමන් වියදම් | | 1,050.00 | | 2,887.50 | | 2,000.00 |
| වැටුප් තාවකාලික | | 19,000.00 | | - | | - |
| අතිකාල දීමනා | | 17,313.93 | | 13,841.78 | | - |
| නිවාඩු දින ගෙවීම් | | - | | - | | |
| ජල හා විදුලිය | | 2,999.48 | | 46,295.86 | | 50,000.00 |
| පාසල්හැරගියවුන් සඳහා පුහුණු | | - | | - | | |
| SME වැඩසටහන | | - | | - | | |
| ශ්‍රම වෙළෙඳපොළ සමීක්ෂණය | | 250,000.00 | | 250,000.00 | | - |
| මානව සම්පත් ක්‍රමෝපාය සංවර්ධනය | | - | | - | | |
| විදේශීය පුහුණු වැඩසටහන | | - | | 210,925.71 | | - |
| MCDP වැඩසටහන | | - | | 35,154.29 | | - |
| කාර්ය මණ්ඩල ශුභසාධනය | | - | | 3,675.00 | | 4,000.00 |
| කාර්යාලය අලුත්වැඩියා සහ නඩත්තුව | | 50,290.65 | | 14,662.50 | | 16,000.00 |
| මානව ප්‍රාග්ධන සමුළුව | | - | | 27,315.00 | | - |
| වැඩබැලීමේ වැටුප් | | - | | 5,562.08 | | - |
| ප්‍රචාරණ ගාස්තු | | - | | 76,007.25 | | - |
| ගොඩනැගිලි හා ව්‍යුහ රඳවාගැනීම | | 445,837.28 | | - | | - |
| ත්‍රීරෝද සමීක්ෂණය පැවැත්වීම | | 60,000.00 | | - | | - |
| වැඩබැලීමේ වැටුප් | | - | | 5,526.08 | | 6,000.00 |
| අනෙකුත් අත්තිකාරම් | | 1 | | - | | - |
| මෝටර් රථ අලුත්වැඩියා සහ නඩත්තුව | | 60,937.26 | | - | | - |
| ප්‍රචාරණය- MCDP | | 20,079.00 | | - | | - |
| | | **1,192,086.32** | | **846,668.75** | | **254,046.47** |
| | | | | | | |
| **කෙටි-කාලීන වෙන්කිරීම්** | **8** | | | | | |
| විගණන ගාස්තුව – 2014 | | 81,580.00 | | - | | - |
| විගණන ගාස්තුව – 2015 | | - | | 81,580.00 | | 81,580.00 |
| විගණන ගාස්තුව – 2016 | | 80,500.00 | | 80,500.00 | | 80,500.00 |
| විගණන ගාස්තුව - 2017 | | 80,500.00 | | 80,500.00 | | 80,500.00 |
| අඩමාන ණය සඳහා වෙන්කිරීම - එන්.බෝපගේ | | 71,162.82 | | 71,162.82 | | 71,162.82 |
| | | **313,742.82** | | **313,742.82** | | **313,742.82** |

| | සටහන් | **2017** | | **2016** | | අයවැයගත මුදල |
|---|---|---|---|---|---|---|
| සේවක ප්‍රතිලාභ | 9 | | | | | |
| පාරිතෝෂිත වෙන්කිරීම් | | 1,990,089.75 | | 1,509,772.75 | | 1,900,000.00 |
| | | 1,990,089.75 | | 1,509,772.75 | | 1,900,000.00 |
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | 10 | 21,133,114.00 | | 21,500,000.00 | | 22,823,801.00 |
| | | | | | | |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය | 11 | | | | | |
| රජයේ ප්‍රදාන - සංවර්ධන කටයුතු | | 6,933,291.72 | | 6,656,903.22 | | 9,000,000.00 |
| විලම්භිත ප්‍රදාන | | 5,689,845.88 | | 4,732,933.84 | | 6,650,000.00 |
| | | 12,623,137.60 | | 11,389,837.06 | | 15,650,000.00 |
| | | | | | | |
| විදේශීය පුහුණු වැඩසටහන් මත ලාභය (අලාභය) | 12 | 6,861,867.08 | | 1,073,187.14 | | 6,000,000.00 |
| | | 6,861,867.08 | | 1,073,187.14 | | 6,000,000.00 |
| | | | | | | |
| වත්කම් බැහැර කිරිම මත ලාභය (අලාභය) | 13 | (1,068,524.32) | | (5,662.59) | | (1,000,000.00) |
| | | | | | | |
| වෙනත් ආදායම් | 14 | | | | | |
| විවිධ ආදායම් | | 32,395.74 | | 91,583.13 | | 40,000.00 |
| ආපදා ණය පොළී | | 108,396.55 | | 93,554.45 | | 120,000.00 |
| | | 140,792.29 | | 185,137.58 | | 160,000.00 |
| පඩිනඩි, වැටුප් සහ සේවක ප්‍රතිලාභ | 15 | | | | | |
| වැටුප් හා පඩිනඩි | | 9,639,681.90 | | 7,190,064.68 | | 9,700,000.00 |
| වැඩබැලීමේ වැටුප් | | 5,634.93 | | 22,534.12 | | - |
| විශේෂ දීමනාව | | - | | 768,331.89 | | |
| ජීවන වියදම් දීමනාව | | 2,530,849.28 | | 2,351,322.58 | | 2,527,200.00 |
| අතුරු දිමනාව | | - | | 1,979,677.42 | | - |
| ගැලපුම් දීමනාව | | 1,972,515.79 | | 1,010,525.71 | | 1,766,930.00 |
| ප්‍රවාහන දීමනාව | | 600,000.00 | | 400,000.00 | | 600,000.00 |
| ඉන්ධන දීමනාව | | 210,600.00 | | 210,600.00 | | 800,000.00 |
| සේ.අ.අ | | 1,348,676.41 | | 1,130,291.11 | | 1,348,000.00 |
| සේ.භා.අ | | 337,169.47 | | 282,554.24 | | 337,000.00 |
| අතිකාල | | 199,324.96 | | 117,509.17 | | 192,000.00 |
| නිවාඩුදින ගෙවීම් | | 16,805.75 | | 9,918.75 | | 8,000.00 |
| තාවකාලික වැටුප් | | 29,500.00 | | 150,144.00 | | - |
| පාරිතෝෂික ගෙවීම් | | 480,317.00 | | 82,684.87 | | - |
| වෘත්තීය දීමනාව | | 72,000.00 | | | | - |
| | | **17,443,075.49** | | **15,706,158.54** | | **17,279,130.00** |

| | සටහන් | 2017 | | 2016 | | අයවැයගත මුදල |
|---|---|---|---|---|---|---|
| **ප්‍රදාන හා අනෙකුත් මාරුකිරීම් ගෙවීම** | **16** | | | | | |
| පුවත් ලිපිය | | 290,177.70 | | 245,768.00 | | 600,000.00 |
| ශ්‍රම වෙළෙඳපොළ සමීක්ෂණය | | 513,512.25 | | 431,733.75 | | 100,000.00 |
| සේවක පුහුණු හා සංවර්ධනය | | 924,031.03 | | 1,802,098.87 | | 1,000,000.00 |
| මාතර දිස්ත්‍රික් සමීක්ෂණය | | - | | 81,081.90 | | - |
| තත්ත්ව හා ඵලදායිතා වැඩසටහන | | 474,833.32 | | 144,462.00 | | 250,000.00 |
| නායකත්ව ගොඩනැගීමට මානව සම්පත් ක්‍රමෝපායක් සංවර්ධනය කිරීම | | 497,158.72 | | 228,695.00 | | 760,000.00 |
| රැකියා අරුණ වැඩසටහන | | - | | 1,624,177.48 | | - |
| තාක්ෂණික අංශයේ දක්ෂතා පරතර අධ්‍යයනය | | 19,995.00 | | 131,449.25 | | 20,000.00 |
| SME අංශය ශක්තිමත් කිරීම | | - | | 529,847.25 | | - |
| සංචාරක අංශයේ දක්ෂතා පරතර අධ්‍යයනය | | 53,530.60 | | 905,510.49 | | 185,000.00 |
| HRM සම්මානය | | 600 | | 1,310.00 | | 50,000.00 |
| අධ්‍යක්ෂ අත්පොත (KPMG) | | 1,162,519.39 | | 122,620.70 | | 1,200,000.00 |
| මානව ප්‍රාග්ධන සමුළුව | | - | | 126,203.04 | | - |
| යාන්ත්‍රණ සංවර්ධනය | | - | | 13,165.00 | | - |
| NHRDC කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් | | - | | 244,884.16 | | - |
| ආපසු පැමිණි සංක්‍රමණිකයින් නැවත මෙහෙයවීම | | 461,165.90 | | - | | 600,000.00 |
| ජාතික මානව සම්පත් ප්‍රතිපත්තිය අනුගමනය කිරීම | | 1,000.00 | | - | | 20,000.00 |
| පාර්ශ්වකාර කමිටුවක් පිහිටුවීම | | 44,911.00 | | - | | 100,000.00 |
| දක්ෂතා වැඩරාමුවක් ක්‍රියාත්මක කිරීම | | 6,360.00 | | - | | 200,000.00 |
| වෘත්තීය මාර්ගෝපදේශ ඒකක ශක්තිමත් කිරීම | | 31,820.00 | | - | | 100,000.00 |
| ඩෙංගු දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය | | 35,980.00 | | - | | 70,000.00 |
| MCDP | | 972,121.80 | | - | | 1,100,000.00 |
| සංඛ්‍යාලේඛන අත්පොත | | 49,266.00 | | - | | 100,000.00 |
| ත්‍රීරෝද අධ්‍යයනය | | 818,399.16 | | - | | 1,480,000.00 |
| රාජ්‍ය අංශය තුළ වැඩකිරීමේ නව මාර්ග | | 27,591.30 | | - | | 50,000.00 |
| නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ක්ෂේත්‍රයේ CSE සමඟ කටයුතු කිරීම | | 342,646.46 | | - | | 400,000.00 |
| | | **6,727,619.63** | | **6,633,006.94** | | **8,385,000.00** |

| | සටහන් | 2017 | | 2016 | | අයවැයගත මුදල |
|---|---|---|---|---|---|---|
| සැපයීම් හා භාවිත කළ පරිභෝජන භාණ්ඩ | 17 | | | | | |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | | 102,990.50 | | 327,750.36 | | 300,000.00 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | | 577,050.00 | | 419,555.00 | | 600,000.00 |
| නිල ඇඳුම් | | - | | 42,645.00 | | - |
| | | **680,040.50** | | **789,950.36** | | **900,000.00** |
| ක්ෂය කිරීම හා ක්‍රමක්ෂය වියදම් | 6 | 5,689,845.88 | | 5,076,989.77 | | 5,700,000.00 |
| ගමන් වියදම්, යැපීම් හා දීමනා | 18 | | | | | |
| දේශීය ගමන් වියදම් හා යැපීම් දීමනාව | | 16,527.50 | | 15,902.50 | | 27,600.00 |
| විගණන සාමාජිකයින් සඳහා දීමනාව | | 84,000.00 | | 54,000.00 | | 80,000.00 |
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික දීමනාව | | 236,000.00 | | 120,000.00 | | 240,000.00 |
| | | **336,527.50** | | **189,902.50** | | **347,600.00** |
| උපයෝගිතා සහ සේවා | 19 | | | | | |
| වරිපනම් | | 40,320.00 | | 44,800.00 | | 50,000.00 |
| විදුලිය | | 548,083.98 | | 659,644.42 | | 500,000.00 |
| ජලය | | 35,247.31 | | 40,409.78 | | 40,000.00 |
| දුරකථන ගාස්තුව හා කුලිය | | 432,962.69 | | 311,755.89 | | 500,000.00 |
| තැපැල් ගාස්තු හා ටෙලෙක්ස් ගාස්තු | | 7,245.00 | | 17,470.00 | | 100,000.00 |
| සනීපාරක්ෂක සේවය | | 544,433.67 | | 593,927.64 | | 593,930.00 |
| ප්‍රචාරණය | | 48,300.00 | | 202,297.50 | | 50,000.00 |
| ආරක්ෂක සේවය | | 959,843.97 | | 910,347.50 | | 910,350.00 |
| අන්තර්ජාල පහසුකම් | | 164,280.00 | | 164,280.00 | | 180,000.00 |
| වෙනත් උපයෝගිතා හා වෙනත් සේවා | | 203,052.25 | | 232,517.50 | | 200,000.00 |
| නීති ගාස්තු | | 10,000.00 | | 19,000.00 | | - |
| | | **2,993,768.87** | | **3,196,272.23** | | **3,124,280.00** |
| නඩත්තු වියදම් | 20 | | | | | |
| ගොඩනැගිලි හා ව්‍යුහ අලුත්වැඩියා සහ නඩත්තුව | | - | | 3,600.00 | | - |
| මෝටර් රථ අලුත්වැඩියා සහ නඩත්තුව | | 838,150.86 | | 1,003,375.79 | | 760,000.00 |
| රථවාහන රක්ෂණය | | 419,869.90 | | 149,949.64 | | 370,000.00 |
| කාර්යාල උපකරණ අලුත්වැඩියා සහ නඩත්තුව | | 133,180.50 | | 117,268.63 | | 10,000.00 |
| පරිගණක අලුත්වැඩියා සහ නඩත්තුව | | 20,872.50 | | 57,526.60 | | 50,000.00 |
| වෙනත් වත්කම් අලුත්වැඩියා සහ නඩත්තුව | | 47,483.60 | | 64,506.47 | | 50,000.00 |
| | | **1,459,557.36** | | **1,396,227.13** | | **1,240,000.00** |
| වෙනත් වියදම් | 21 | | | | | |
| විගණක ගාස්තුව | | 80,500.00 | | 80,500.00 | | 80,500.00 |
| පුවත්පත් හා සඟරා | | 22,960.00 | | 24,380.00 | | 23,000.00 |
| සේවක සුභසාධනය | | 23,045.00 | | 47,775.00 | | 25,000.00 |
| සංග්‍රහ කිරීම් | | 65,866.50 | | 56,333.00 | | 65,000.00 |
| | | **192,371.50** | | **208,988.00** | | **193,500.00** |

**<u>සටහන් අංක 12 – පැහැදිලි කිරීම</u>**

**<u>ආදායම</u>**

| | |
|---|---:|
| පාඨමාලා ගාස්තුව | 38,550,000.00 |
| <u>අඩුකළා</u> | |
| **<u>වියදම්</u>** | |
| ප්‍රවේශපත් | 7,401077.00 |
| වීසා | 953,934.00 |
| මැලේසියාවේ පුත්‍ර විශ්ව විද්‍යාලයට ගෙවීම | 20,786,167.72 |
| සම්පත් දායක ගාස්තුව (දේශීය සැසි) | 995,714.28 |
| ශාලා වෙන්කිරීම | 1,125,384.34 |
| සංග්‍රහ වියදම් | 19,660.00 |
| වෙනත් | 75,808.60 |
| මුද්‍රණය හා ලිපිද්‍රව්‍ය | 101,769.99 |
| සම්බන්ධීකාරක යැපුම් දිමනාව | 120,037.99 |
| සහතික ප්‍රදාන උත්සවය | 88,500.00 |
| ප්‍රචාරණය | 20,079.00 |
| **මුළු වියදම්** | **31,688,132.92** |
| **විදේශිය පුහුණු වැඩසටහන් මත අතිරික්තය (හිගය)** | **6,861,867.08** |

## 12. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් විස්තරාත්මක සටහන්වල සාරාංශයකින් සමන්විත සටහන්

**1.** මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව 1997 අංක 18 දරණ පනතින් පිහිටුවනු ලැබිය. ආයතනයට පවරණ ලද බලතල යටතේ, මානව සම්පත් සංවර්ධනයට අදාළ සියලුම කටයුතු සහ මානව සම්පත් සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම කෙරෙහි ප්‍රමුඛතාව ලබාදේ.

**2. මූල්‍ය ප්‍රකාශ නිකුත්කිරීම සඳහා ගිණුම් පවත්වා ගැනීම සහ බලයදීම**

මූල්‍ය පනතේ (1971 අංක 38) 14 වගන්තිය අනුව, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව රාජ්‍ය ආයතනයක් ලෙස, එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේදී ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීම, මුදාහැරීම සහ කාර්යසාධනය පිළිබඳ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් සකස් කරනු ලැබේ. එකී වාර්තාවේ වසර තුළ සභාව වෙත අදාළ අමාත්‍යාංශය විසින් දෙනු ලබන උපදෙස් දක්වා ඇත. එකී වාර්තාවේ පිටපත් අදාළ අමාත්‍යාංශයට සහ මුදල් අමාත්‍යාංශයට (නියමිත අමාත්‍යාංශය නොවේ නම්), සැලසුම් කිරීමේ අමාත්‍යාංශයට හා විගණකාධිපති වෙත එම වසර අවසාන වී මාස හතරක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය පනතේ (1971 අංක 38) 14 වගන්තිය අනුව,එක් එක් මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය ආයතනයක ගිණුම් එම වසර අවසාන වීමෙන් පසු මාස හතරක් ඇතුළත විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු අතර එසේ ඉදිරිපත් කිරීමේදී ඔහු විසින් නියම කරනු ලබන ආකාරයෙන් ගිණුම් පිළිබඳ වාර්තා ද ඉදිරිපත් කළ යුතුය. මෙම උප වගන්තියේ දක්වා ඇති විධිවිධාන උල්ලංඝනය කරන හෝ ඒවාට අනුකූල වීමට නොහැකිවන යම් ආයතනයක්, මෙම පනත යටතේ වැරදිකරුවෙක් වන අතර, මහේස්ත්‍රාත්වරයෙක් ඉදිරියේ කෙටි පරීක්ෂණයකින් පසු වැරදිකරු කිරීම මත රුපියල් දහස නොඉක්මවන දඩයකට යටත් කරනු ලැබේ.

**3. අනුකූලතා ප්‍රකාශය**

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත්කළ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කරනු ලබයි.

**4. ඇගයීමේ පදනම්**

ලීබඩු හා සවිකිරීම්, කාර්යාල උපකරණ, විදුලිමය සවිකිරීම් හා උපකරණ, පරිගණක, මෝටර් රථ සහ අනෙකුත් වත්කම් සඳහා පිළිවෙළින් ශ්‍රී ලංකාවේ තක්සේරු දෙපාර්තමේන්තුව සහ ස්වාධීන තක්සේරුකරුවන් විසින් 2008, 2011, 2014 සහ 2016 වසර තුළ සිදුකරන ලද ප්‍රත්‍යාගණනය සඳහා හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පරිවර්තනය යටතේ සකස් කෙරේ.

**5. වත්කම් ඇගයීමේ පදනම්**

දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයකිරීම අඩුකළ පිරිවැයට/වටිනාකමට සඳහන් කරනු ලබයි.

**5.1** සියලුම දේපළ, පිරියත හා උපකරණ සඳහා වියදම් කිරීමට සිදුවන කාලීන අයකිරීම් මඟින් ස්ථාවර වත්කම්වල තක්සේරු කළ ඵලදායි ජීව කාලය පුරා ඒවායේ පිරිවැය ක්‍රමානුකූලව බෙදී යන පරිදි අයකරනු ලැබේ.

**5.2** මිලදීගත් වසර තුළ කිසිදු ක්ෂයකිරීමක් වෙන් කරනු නොලබන අතර 2009 වසරට පෙර මිලදීගත් වත්කම් සඳහා බැහැර කරන වසර තුළ සම්පූර්ණ වසරේ ක්ෂයකිරීම වෙන් කරන අතර 2009 සිට ඉදිරියට එක් එක් වත්කම් මිලදී ගත් දිනය/බැහැර කරන දිනය මත පදනම් වී ක්ෂයකිරීම ගණනය කරනු ලැබේ.

**5.3** පරිභෝජන භාණ්ඩ තොග පිරිවැයේ අවමයට හා ශුද්ධ උපලබ්ධි කළ හැකි වටිනාකමට අගයනු ලබයි.

**6. ක්ෂයකිරීම**

වත්කම් පන්ති හා ක්ෂයකිරීමේ අනුපාත පහත පරිදි වේ. වත්කම් පන්ති ඒවායේ ස්වභාවය හා ආයතනය විසින් ඒවායේ භාවිතය අනුව තීරණය කෙරේ.

| | |
|---|---|
| ගොඩනැගිලි හා ව්‍යුහ | 5% |
| ලීබඩු හා සවිකිරීම් | 10% |
| කාර්යාල උපකරණ | 10% |
| විදුලිමය සවිකිරීම් හා උපකරණ | 20% |
| පරිගණක | 20% |
| පරිගණක මෘදුකාංග | 25% |
| මෝටර් වාහන | 20% |
| පොත් | 10% |
| වෙනත් වත්කම් | 10% |

**7. වාර්තාකරන දිනයෙන් පසු සිදුවීම්**

සියලුම වැදගත් ශේෂ පත්‍ර සිදුවීම් සලකා බලනු ලබන අතර අනාවරණය කළ යුතු සුදුසු ගැලපීම් මූල්‍ය ප්‍රකාශ තුළ සිදුකරනු ලැබ ඇත. පරිශ්‍රයේ නවීකරණ කටයුතු 2017 ජනවාරි ආරම්භ කළ අතර දෙසැම්බර්වල අවසන් කරන ලදි. "ලීමා" ඉදිකිරීම් සමාගමට ගෙවිය යුතු රඳවාගැනීමේ මුදල ශේෂ පත්‍රය තුළ ගෙවිය යුතු වියදමක් ලෙස හඳුනාගෙන ඇති අතර අනුරූප වත්කම් ගොඩනැගිලි හා ව්‍යුහ යටතේ හඳුනා ගනු ලැබීය.

**8. වත්කම් මාරු කිරීම**

ලීබඩු හා සවිකිරීම්, කාර්යාල උපකරණ වැනි වත්කම් හා අනෙකුත් වත්කම් නවීකරණය හේතු කොට ගෙන බැහැර කර ඇත. මෙම වත්කම් පුහුණු මධ්‍යස්ථානවල භාවිත කිරීම සඳහා වෘත්තිය පුහුණු

අධිකාරිය වෙත මාරු කර ඇත. ඉහත වත්කම් මාරුකිරීම සඳහා අවශ්‍ය අනුමැතිය අමාත්‍යාංශයෙන් ලබාගන්නා ලදි.

**9. රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය**

මහා භාණ්ඩාගාරයෙන් ලද පුනරාවර්තන ප්‍රදාන සහ ප්‍රාග්ධන ප්‍රදාන පිළිවෙළින් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සපුරාලීමට භාවිත කෙරේ. පර්යේෂණ හා සංවර්ධන කටයුතු (NHRDC ක්‍රියාකාරකම්) සඳහා දරණ ලද මුදලක් සහ වසර තුළ අයකළ ක්ෂයකිරීමට සමාන මුදලක් ප්‍රාග්ධන වත්කම්වල ඵලදායි ජීවකාලය පුරා ක්‍රමානුකූල පදනමක් මත ආදායම් ලෙස හඳුනා ගැනිණි.

**10. විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය**

10.1 **නිර්ණය කළ දායක සැලැස්ම - සේ.අ.අ- සේ.නි.භා.අ**

සේවක අර්ථසාධක අරමුදල (E.P.F) සහ සේවානියුක්තියන්ගේ භාර අරමුදල (E.T.F) සඳහා සුදුසුකම් ලබන සියලුම සේවකයින් අදාළ ව්‍යවස්ථාපිත සහ රෙගුලාසි සමඟ අදාළ දායක අරමුදල් මගින් ආවරණය කෙරේ. සියලුම දායක මුදල් සේවක අර්ථසාධක අරමුදල් සහ සේවානියුක්තියන්ගේ භාර අරමුදල් පනතේ නියමයන් හා රෙගුලාසි අනුව සේ.අ.අ සහ සේ.නි.භා.අරමුදලට ප්‍රේෂණය කරන ලදි.

10.2 **විශ්‍රාම පාරිතෝෂික**

සියලුම සේවකයින් සඳහා "සේවක ප්‍රතිලාභ" පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු වන විශ්‍රාම පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශයන් හි වෙන්කිරීම් සිදු කෙරේ. පාරිතෝෂික වගකීම සඳහා බාහිරින් අරමුදල් ලබා නොගන්නා අතරම ආයුගණකව ඇගයීම් සිදුකර නොමැත.

**11. මූල්‍ය කාර්ය සාධනය**

මෙහෙයුම් සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තුව තුළ දරණ ලද සියලුම පිරිවැය ආදායමට අයකරනු ලැබ ඇත. ආදායම හා වියදම්වල හිඟය/ අතිරික්තය සියලුම දැනුවත් වගකීම් සහ වත්කම් ක්ෂයකිරීම සඳහා වෙන්කිරීම් සිදුකිරීමෙන් පසු ගණනය කර ඇත.

**12. මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි 27 වගන්තියේ දක්වා ඇති පරිදි වක්‍ර ක්‍රමය භාවිතයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලබයි.

**13. අමාත්‍යාංශය විසින් පවරනු ලබන මෝටර් රථ**

වාහන අංකය WP- PD 6170 හා චැසි අංකය JNICJUD22Z0116541 දරන වාහනය 2016.02.01 දින සිට තාවකාලික පදනමක් මත NHRDC වෙත ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් වෙන්කරනු ලැබ ඇත.

## 13.විගණන විමසුම් හා පිළිතුරු

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | වීවීවයි/ඊ/එන්එච්ආර්ඩීසී/ 1/17/15 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2018 ජූලි 19 දින |

සභාපති

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පනතේ 24 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂයපථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය

හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගෙවිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂ වටිනාකම රු. 1,192,086 ක් වූ අතර ඉන් ශ්‍රම වෙළෙඳපොල සමීක්ෂණය සඳහා ගෙවිය යුතු රු. 250,000 ක ශේෂයක් වසරකට වැඩි කාලයක් නිරවුල් නොකර පැවතුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පනත අනුව සභාව විසින් එක් මූල්‍ය වර්ෂයක් සඳහා අවම වශයෙන් රැස්වීම් 12 ක් පැවැත්විය යුතු වුවත් 2017 වර්ෂය සඳහා රැස්වීම් 04 ක් පමණක් පවත්වා තිබුණි.

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේදී සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 4,167,580 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 945,003 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 3,222,577 ක වර්ධනයක් නිරීක්ෂණය විය. විදේශීය පුහුණු වැඩසටහන් මඟින් රු. 5,788,680 ක් ලාභ ඉපයීම මෙම වර්ධනය සඳහා මූලික හේතුව වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2015 වර්ෂයේදී ඌණතාවයක්ද අනෙකුත් වර්ෂවල මූල්‍ය අතිරික්තයන්ද පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමෙන් පසු ආයතනයේ දායකත්වය 2013 වර්ෂයේ රු. 9,634,876 ක සිට 2017 වර්ෂයේ රු. 21,610,655 ක් දක්වා අඛණ්ඩ වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1. කාර්යසාධනය

4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම මගින් වර්ෂය තුළ ව්‍යාපෘති / වැඩසටහන් 29 සම්පූර්ණ කිරීම සඳහා රු.මිලියන 15.65 ක් ප්‍රතිපාදන කර තිබුණ ද එම වැඩසටහන්/ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු. මිලියන 17.39 ක් වැය කර තිබුණි. ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම මගින් වෙන්කර තිබූ මුදල් ප්‍රමාණය ඉක්මවා රු. මිලියන 1.74 ක් වැය කර තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමට සැලසුම් කර තිබූ රු. මිලියන 2.93 වූ ව්‍යාපෘති / වැඩසටහන් 08 ක් අවසන් කිරීමට නොහැකි වී තිබූ අතර ඒ අතුරින් රු. මිලියන 0.65 ක් වූ වැඩසටහන් 03 ක භෞතික කාර්යසාධනය සියයට 50 කට අඩු මට්ටමක පැවතුණි.

(ඇ) ජාතික මානව සම්පත් සංවර්ධන සභාව විසින් වාර්ෂිකව ජර්නල් 2 ක් පිළියෙල කර නිකුත් කිරීමට ඉලක්ක කළ ද 2017 වර්ෂයේදී ඉන් එක් ජර්නලයක් පමණක් නිකුත් කර තිබුණි.

5. තිරසර සංවර්ධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

### 6.1 අභ්‍යන්තර විගණනය

-----------------------

සභාව තුළ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබූ අතර අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන අංශය මගින් ද වර්ෂය තුළ කිසිදු විගණනයක් සිදුකර නොතිබුණි. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර තිබූ 2011 නොවැම්බර් 15 දිනැති අංක ඩීඑම්ඒ/06 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය මගින් අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත් බව ඇගයීම සඳහා අභ්‍යන්තර විගණනයක අවශ්‍යතාවය දක්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

### 6.2 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව අයවැය ලේඛනය 2017 දෙසැම්බර් මාසයේදී සංශෝධනය කර තිබූ නමුත් ඒ සඳහා සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) සංශෝධිත අයවැය අනුව පුනරාවර්තන වියදම්වල සියයට 10 සිට සියයට 65 දක්වා ද ප්‍රාග්ධන වියදම්වල සියයට 15 සිට සියයට 100 දක්වා ද විචලනයන් නිරීක්ෂණය විය. අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් නොකල පරිගණක මිලදී ගැනීම සඳහා රු.527,420 ක් වියදම් දරා තිබූ අතර වාහන මිලදී ගැනීම සඳහා වෙන්කරන ලද රු. 400,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

### 6.3 නොවිසඳී ඇති විගණන ඡේද

------------------------------

ස්ථාවර වත්කම් ලේඛනයේ පවතින පිරිවැය රු.354,332 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 26 ක ඌනතාවයක් සම්බන්ධව 2015 නොවැම්බර් 19 දිනැති පරීක්ෂණ වාර්තාවේ වූ නිර්දේශ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

---------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | වත්කම් පාලනය | වත්කම් ඉවත් කිරීමේදී නිවැරදි ක්‍රමවේද අනුගමනය නොකිරීම. |
| (ආ) | කාර්යසාධනය | පනතේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් වැඩ සටහන් සකස් කර ක්‍රියාත්මක නොකිරීම. |

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ අංක VTY/E/NHRDC/1/17/15හා 2017.04.20 දිනැති විගණකාධිපති වාර්තාව හා බැඳේ. ඒ අනුව මාගේ පැහැදිලි කිරීම් පහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

2.4 **ගෙවිය යුතු ශේෂ**

2017 දෙසැම්බර් වසර තුළදී ගෙවිය යුතු වියදම් තුළ ශ්‍රම වෙළඳපොළ වාර්තාව පිළියෙල කිරීම වෙනුවෙන් නියමිත තත්ත්වයෙන් ගෙවීමට ඇති රු. 250,000/- මුදලද ඇතුළත්ය. එම කාර්යය භාරගෙන තිබූ ආචාර්ය දුනුසිංහ මහතා නියමිත දින අධ්‍යයන වාර්තාව ඉදිරිපත් නොකළ බැවින් මෙම ගෙවීම නතර කර ගන්නා ලදි. මෙම වාර්තාව මෙම වසර තුළ නිම කිරීමට කටයුතු සැළසුම් කර ඇත.

2.3 **නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූළ නොවීම**

පාලක මණ්ඩල සංයුතිය සලකා බැලීමේදී එම සාමාජිකයින් සෑම මාසයකදීම කැඳවීම අපහසු කාර්යයකි. එමෙන්ම ආයතනයේ කාර්යයන් සැලකීමේදී බොහෝ විට මාසිකව පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා කරුණු නොමැති අවස්ථා ඇත. පාලක මණ්ඩල රැස්වීමක් පැවැත්වීම සඳහා රු. 100,000.00 කට අධික මුදලක් වැය වේ. එබැවින් අරමුණකින් තොරව පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වීම නිශ්කාර්ය වියදමකි. එබැවින් කාර්ය සාධනය සිදු කළ හැකි අයුරින් සහ පාලක මණ්ඩල අනුමැතිය අවශ්‍ය කාරණා උද්ගත වූ විට පාලක මණ්ඩල රැස්වීම් පවත්වා ඇත. එම සෑම රැස්වීමකදීම කාර්යය සාධනය ඉදිරිපත් කර ඇති අතර ඒ බව පාලක මණ්ඩල වාර්තාවන්හි සඳහන් වේ. තවද සෑම රැස්වීමකදීම මානව සම්පත් සංවර්ධනය පිළිබඳව ප්‍රතිපත්තිමය කරුණු යටතේ විශේෂ ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා සිදු කරනු ලැබේ. 2017වසර තුළ පහත සඳහන් කාරණා සාකච්ඡාවට බඳුන් කර ඇත.

- New Ways of Working in the Public Sector
- "Resolving the Impending Staff Shortage in the Tourism Industry"
- Labour Law Reforms
- Create learning and development opportunities for public sector staff by collaborating with foreign Universities.
- Identify strategies to redeploy three-wheeler drivers into the industry
- Skilled workers for the technology sector: Partner with industry launch an accelerated training program to generate 1000 young data professionals over 5 years. i.e Data Science program

- ❖ Competency Framework for the Public Sector.
- ❖ Directors` Handbook on Good Governance

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1.1 **ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

(අ) සභාවේ කාර්යාල නවීකරණය හා 5S හඳුන්වාදීම 2016 හා 2017 වසර දෙක සඳහාම පැවති ව්‍යාපෘතියකි. මේ සඳහා 2016 අයවැයෙන් රු. 5,937,000/- හා 2017 වසරේ අයවැයෙන් රු. 4,200,000/- ක් ද වෙන්කර තිබුණි. මෙම නවීකරණ කටයුතු 2016 ආරම්භ කළ ද එම ඉදිකිරීම් සම්පූර්ණ කරන ලද්දේ 2017 වසරේදීය.

මෙම ව්‍යාපෘතිය වසර දෙකක් දක්වා තිබූ බැවින් එම වසර 2 තුළදී පැවැති අයවැය ප්‍රතිපාදනයන් භාවිත කළ අතර එම කාලය සඳහා මුළු ප්‍රතිපාදනය වූ රුපියල් මිලියන 10.13 වියදම් සීමාව යටතේ මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කෙරිණි.

(ආ) වසර තුළ සැළසුම් කළ වැඩසටහන් අතරින් සියයට 50 ට අඩු භෞතික කාර්යසාධනයක් වැඩසටහන් 03 සම්බන්ධ විස්තර පහත පරිදි වේ.

**(ඇ) පාසල් මාර්ගෝපදේශන අංශ ශක්තිමත් කිරීම**

තෝරා ගත් පාසල් 25ක වෘත්තීය මාර්ගෝපදේශන අංශ ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය තුළ ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය සමඟ සාකච්ඡා කිහිපයක් පැවැත්වුව ද පෞද්ගලික අංශයේ සමාගම් ඒ සඳහා ඉදිරිපත් වී නොමැත. එබැවින් 2018 වර්ෂයේදි පාසල් 25 තුළ වෘත්තීය මාර්ගෝපදේශන අවශ්‍යතා පිළිබඳ අධ්‍යයනයක් සිදු කර, අධ්‍යාපන අමාත්‍යාංශයත් සමඟ ඒකාබද්ධව දිස්ත්‍රික්ක හතරක තෝරා ගත් පාසල් 4 ක වෘත්තීය මාර්ගෝපදේශන ශක්තිමත් කිරීමේ වැඩසටහන් නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇත.

**<u>ත්‍රිරෝද රථ රියැදුරන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ උපායමාර්ග</u>**

ත්‍රිරෝද රථ රියැදුරන්ගේ ජීවන තත්වය උසස් කිරීමේ උපායමාර්ග සමීක්ෂණයට අදාළ දත්ත විශ්ලේෂණය කර කෙටුම්පත් වාර්තාව සකස්කර ඇති අතර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට ද එය ඉදිරිපත් කර ඇත. මේ වන විට එය මුද්‍රණය සඳහා කටයුතු කරමින් පවතී.

**<u>HCM Awards</u>**

මෙම ප්‍රදාන ලබාදීමේ උත්සවය පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශය යන දෙඅංශයටම වෙන් වශයෙන් පැවැත්වීමට සැළසුම් කර තිබූ අතර පෞද්ගලික අංශයේ උත්සවය AHRP ආයතනය සමඟ එක්ව සාර්ථකව නිම කරන ලදී. එහෙත් රාජ්‍ය අංශයේ **“HCM Awards”** වැඩසටහනට අදාළව පවත්වන ලද

දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා රාජ්‍ය අංශයේ නිළධාරීන් ඉතා සුළු සංඛ්‍යාවක් පමණක් සහභාගී වූ බැවින් තරඟය පැවැත්වීම සඳහා ප්‍රමාණවත් සහභාගීත්වයක් නොමැති බව පෙනී ගියේය. තව ද මේ සඳහා අවශ්‍ය තෝරා ගැනීමේ නිර්නායක ද සකස් කර තිබූ අතර සාර්ථක නොවන බැවින් එය නතර කරන ලදි.

(ඈ) ජර්නලය පිළියෙල කිරීම සඳහා ලිපි ඉල්ලීම් කර විවිධ පාර්ශවයන් හට දැනුම් දුන්නද ප්‍රමාණවත් ලිපි හා වාර්තා නොලැබීම හේතුවෙන් 2017 වසර සඳහා එක් ජර්නලයක් පමණක් පිළියෙල කරන ලදි.

## 5. <u>තිරසාර සංවර්ධනය</u>

### 5.1 තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

තිරසාර අරමුණු ළගා කර ගැනීම සම්බන්ධයෙන් ලේඛණයක් 2017 වසරේ සකස් කර නොතිබුණද එම අරමුණු ළගා කර ගැනීම සම්බන්ධයෙන් ව්‍යාපෘති 2017 හා 2018 වසර වල ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණි.

උදාහරණ ලෙස -

- ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් නැංවීමේ ව්‍යාපෘතිය

තවද ඉදිරියේදී මෙම තිරසාර අරමුණු ළගා කර ගැනීම සම්බන්ධයෙන් අදාළ ලේඛන සකස් කරන අතර මේ පිළිබඳව නිලධාරීන් දැනුවත් කර ඇත.

## 06. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

### 6.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් 2016 වසරේ ද කළමණාකරණ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර තිබුණ ද ඒ සඳහා අනුමැතියක් නොලැබුණි. නමුත් තව දුරටත් 2017 වසරේ ඉල්ලීම් කර තිබූ අතර මේ සඳහා අමාත්‍යාංශය මගින් නිළධාරියෙකු නම් කර එවා තිබුණි. එනමුදු එම නිළධාරීන්ගේ කාර්ය බහුලත්වය නිසා එම නිළධාරියාද නොපැමිනුණේය.

### 6.2 අයවැය ලේඛණමය පාලනය

(අ) 2017 දෙසැම්බර් මාසයේ සංශෝධනය කළ අයවැය ලේඛණය සඳහා 2018 ජනවාරි මාසයේ පැවති පාලක සභා රැස්වීමට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන ඇත.

(ආ) ප්‍රාග්ධන වියදම් විචලනයට ප්‍රධාන හේතුවක් වූයේ ආයතන ප්‍රතිසංවිධානය සඳහා දැරීමට සිදු වූ වියදමයි. මේ සඳහා 2016 අයවැයෙන් 5,937,000/- වෙන් කර තිබූ අතර එය භාවිත කර ගෙවීම සිදු කරන ලද්දේ 2017 වර්ෂයේ එම කාර්යය නිම කිරීමෙන් අනතුරුවය.

**6.3 නොවිසඳී ඇති විගණන භේද**

ස්ථාවර වත්කම් ලේඛණයේ පවතින අයිතම 26 සම්බන්ධයෙන් පත්කළ කමිටු වාර්තාව 2017.12.20 වන දින ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර ඇත. එම කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් 2018/04/03 පැවති විගණන හා කළමනාකරණ කමිටු උපදෙස් ලබාගෙන ඇති අතර මීළඟ පාලක සභා රැස්වීමට එම තීරණ ඉදිරිපත් කර අනුමැතිය පරිදි ගිණුම්වලින් කපා හරින ලෙස උපදෙස් ලැබී ඇත.

කේ.ඒ. ලලිතධීර
අධ්‍යක්ෂ